(නවවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 4(14).]

# පාර්ලිමේන්තුවේ අංක 4 දරන
# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2021 ඔක්තෝබර් 29 සිකුරාදා**

---

**2021 නොවැම්බර් 09 අඟහරුවාදා**

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*

අග්‍රාමාත්‍යතුමා සහ ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා,— ජාතික චිත්‍රපට සංස්ථාවේ වාර්ෂික වාර්තාව (2013),— 1980 අංක 45 දරන පනතින් සංශෝධිත 1971 අංක 47 දරන ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථා පනතේ 32(1) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(1) වගන්තිය යටතේ 2018.02.20 වන දින ඉදිරිපත් කරන ලද 2013.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජාතික චිත්‍රපට සංස්ථාවේ 2013 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(නෛතික කටයුතු (දූෂණ විරෝධී) හා මාධ්‍ය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2020.01.24 දින සලකා බලන ලදී.)

*

අග්‍රාමාත්‍යතුමා සහ ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා,— ජාතික චිත්‍රපට සංස්ථාවේ වාර්ෂික වාර්තාව (2014),— 1980 අංක 45 දරන පනතින් සංශෝධිත 1971 අංක 47 දරන ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථා පනතේ 32(1) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(1) වගන්තිය යටතේ 2018.02.20 දින ඉදිරිපත් කරන ලද 2014.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජාතික චිත්‍රපට සංස්ථාවේ 2014 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(නෛතික කටයුතු (දූෂණ විරෝධී) හා මාධ්‍ය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2020.01.24 දින සලකා බලන ලදී.)

*

ප්‍රවාහන අමාත්‍යතුමිය,— ජාතික ගමනා ගමන කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව (2016),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(C) වගන්තිය යටතේ 2019.06.19 දින ඉදිරිපත් කරන ලද 2016.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජාතික ගමනා ගමන කොමිෂන් සභාවේ 2016 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(ප්‍රවාහනය හා සන්නිවේදනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2020.02.05 දින සලකා බලන ලදී.)

*

ජනමාධ්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ වාර්ෂික වාර්තා (2013 හා 2014),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2019.03.09 දින ඉදිරිපත් කරන ලද 2013.12.31 හා 2014.12.31 දිනයන්ගෙන් අවසන් වූ වර්ෂ සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් 2013 සහ 2014 වර්ෂ සඳහා ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ වාර්ෂික වාර්තා අනුමත කළ යුතු ය.

(නෛතික කටයුතු (දූෂණ විරෝධී) හා මාධ්‍ය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2020.01.24 දින සලකා බලන ලදී.)

*

ජනමාධ්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ වාර්ෂික වාර්තාව (2015),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2018.10.10 දින ඉදිරිපත් කරන ලද 2015.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් 2015 වර්ෂය සඳහා ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(නෛතික කටයුතු (දූෂණ විරෝධී) හා මාධ්‍ය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2020.01.24 දින සලකා බලන ලදී.)

*

ජනමාධ්‍ය අමාත්‍යතුමා,— සීමාසහිත ලංකා එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමේ වාර්ෂික වාර්තාව (2016),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2019.06.06 දින ඉදිරිපත් කරන ලද 2016.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් 2016 වර්ෂය සඳහා සීමාසහිත ලංකා එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(නෛතික කටයුතු (දූෂණ විරෝධී) හා මාධ්‍ය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2020.01.24 දින සලකා බලන ලදී.)

*

ජනමාධ්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් ප්‍රකාශනය (2015),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2019.02.21 දින ඉදිරිපත් කරන ලද 2015.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් 2015 වර්ෂයේ ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් ප්‍රකාශනය අනුමත කළ යුතු ය.

(නෛතික කටයුතු (දූෂණ විරෝධී) හා මාධ්‍ය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2020.01.24 දින සලකා බලන ලදී.)

*

ජනමාධ්‍ය අමාත්‍යතුමා,— සැලසිනේ රූපවාහිනී ආයතනයේ වාර්ෂික වාර්තාව (2016),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2019.02.22 දින ඉදිරිපත් කරන ලද 2016.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් 2016 වර්ෂයේ සැලසිනේ රූපවාහිනී ආයතනයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(නෛතික කටයුතු (දූෂණ විරෝධී) හා මාධ්‍ය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2020.01.24 දින සලකා බලන ලදී.)

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

**2021 නොවැම්බර් 13 සෙනසුරාදා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

12/2020

ගරු හේෂා විතානගේ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2018 වර්ෂයේදී ඇති වූ නියඟය හේතුවෙන් රත්නපුර දිස්ත්‍රික්කයේ පීඩාවට පත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස;

(ii) ඒ අතරට ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇතුළත් නොවන්නේ නම්, හේතු;

කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 2018 වර්ෂයේ නියං සහනාධාර ලබා දීමේ අදියර II යටතේ සහන ලබා දුන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස;

(ii) ඒ සඳහා වැය කරන ලද මුදල;

එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) 2018 වර්ෂයේ නියං සහනාධාර ලබා දීමේ අදියර II යටතේ නිකුත් කළ චක්‍රලේඛ;

(ii) ඒ අතරින් අවසන්වරට ක්‍රියාත්මක වූ වලංගු චක්‍රලේඛය;

(iii) එම චක්‍රලේඛයට අනුව රත්නපුර දිස්ත්‍රික්කයේ තෝරාගත් ප්‍රතිලාභීන් සංඛ්‍යාව සහ සහනාධාර ගෙවීමට වැය කළ මුදල එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන්;

(iv) NDR/2018/03 චක්‍රලේඛයට අනුව රත්නපුර දිස්ත්‍රික්කයේ හඳුනාගත් ප්‍රතිලාභීන් සංඛ්‍යාව එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන්;

කවරේද යන්න තවදුරටත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

767/2020

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාවේ වගා කළ හැකි බෝග වර්ග ගණනාවක් ආනයනය කරනු ලබන බව එතුමා පිළිගන්නේද;

(ii) සහල්, බඩඉරිඟු, මුං, කව්පි, ඉඟුරු සහ කහ ආදියෙහි වාර්ෂික අවශ්‍යතාවය මේ වනවිට හඳුනාගෙන තිබේද;

(iii) එසේ නම්, එම අවශ්‍යතාවය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ඉහත සඳහන් බෝග ශ්‍රී ලංකාවේ වගා කිරීම සඳහා වැඩපිළිවෙළක් සකස් කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1590/2021

ගරු විජිත හේරත් මහතා,— ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කඩුවෙල, උතුරු හෝකන්දර ප්‍රදේශයේ ගම්මාන රාශියක නිවාස විශාල සංඛ්‍යාවකට ලබා දී ඇති ජල සැපයුම උදෑසන කාලයේදී අඩාල වන අතර එය යථා තත්වයට පත්වන්නේ පෙ.ව. 10.00ට පමණ බවත්, ප.ව. 5.00ට පමණ නැවත ඇණහිටින ජල සැපයුම යථා තත්ත්වයට පත්වන්නේ රාත්‍රී 9.00න් පසුව බවත්;

(ii) නිවාඩු දිනවල බොහෝ අවස්ථාවලදී සම්පූර්ණ දිවා කාලයටම ජලය නොලැබෙන බවත්;

(iii) විශේෂයෙන් එක් මහලක් හෝ සහිතව ඉදිකරනු ලැබූ නිවාසවලට මෙම ගැටළුව තදින්ම බලපා ඇති බවත්;

(iv) මේ සම්බන්ධයෙන් ජල සම්පාදන අමාත්‍යාංශය දැනුම්වත් කර තිබුණ ද මෙතෙක් විසඳුමක් ලබාදී නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත ප්‍රදේශවාසීන්ට දවස පුරා අඛණ්ඩව ජලය ලැබෙන පරිදි මෙම ගැටලුව කඩිනමින් විසඳීමට අවශ්‍ය පියවර ගන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1908/2021

ගරු ජගත් පුෂ්පකුමාර මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට 2019 දක්වා වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ යම් අක්‍රමිකතාවයක්, අයථා පත්වීමක්, දූෂණ ක්‍රියාවක් හෝ නීති විරෝධි ක්‍රියාවක් සිදු වී තිබේද;

(ii) එසේ නම්, ඒවා වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත සඳහන් එක් එක් කරුණ හේතුවෙන් රජයට අහිමි වී ඇති මූල්‍ය, දේපළ හා මානව සම්පත්වල වටිනාකම වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත (අ) (i) හි සඳහන් ක්‍රියාවන්ට වගකිව යුතු නිලධාරින් හඳුනාගැනීමට විමර්ශන සිදු කර තිබේද;

(ii) වගකිව යුතු නිලධාරින් හඳුනාගෙන ඇත්නම්, ඔවුන්ට එරෙහිව ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iii) ඔවුන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගෙන නොමැති නම්, ඊට හේතු කවරේද;

(iv) ඉදිරියේදී ඔවුන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගනු ලබන්නේද;

(v) ඉදිරියේදී සිදු විය හැකි මෙවැනි ක්‍රියාවන් වැළැක්වීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1997/2021

ගරු ෆයිසාල් කාසිම් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 1994 - 2014 අමප/16/0323/734/002 හා 2016.03.02 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි සහ විශ්‍රාමික උපගුරු එම්.එස්. එස්. රලීනා මහත්මිය (විශ්‍රාම අංක 01-1020485 හා ජාතික හැඳුනුම්පත් අංක 498042872X දරන) අමතන ලද, ගාල්ල කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයාගේ අංක ගා/කලාප/ගු.ආ./2/5 විශ්‍රාම සහ 2017.05.29 දිනැති ලිපියේ සඳහන් පරිදි 2005.11.01 දිනට රලීනා මහත්මිය වෙත ලබා දිය යුතු වැටුප් වර්ධක අගය මත (645 x 2 = 1,290) විශ්‍රාම වැටුප ගණනය කිරීමේදී ඇයට හිමිවිය යුතු මුළු හිඟ මුදල කොපමණද;

(ii) ඉහත තීරණය පරිදි රු.198,660/= ක් වන වැටුප් පියවරේ අගය මත 2005.11.01 සිට 2018.08.01 දින දක්වා මාස 154ක් සඳහා ගෙවිය යුතු හිඟ විශ්‍රාම වැටුප සැකසීමේදී යම් දෝෂයක් සිදු වී තිබෙන බව රලීනා මහත්මිය විසින් අදාළ ආයතන දැනුම්වත් කරන ලද බව දන්නේද;

(iii) එසේ නම්, රලීනා මහත්මියගේ වැටුප් වර්ධක නිවැරදි ලෙස ගණනය කර ඇයට හිමි හිඟ විශ්‍රාම වැටුප් මුදල ලබාදීමට පියවර ගන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2021 නොවැම්බර් 15 සඳුදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

778/2020

ගරු කේ. කාදර් මස්තාන් මහතා,— ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) මන්නාරම දිස්ත්‍රික්කයේ, මුසලි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නැවත පදිංචි කිරීමේ කටයුතු සඳහා අහත්තිමුරිප්පු අලක්කට්ටු ගම්මානයේ පිහිටා ඇති ඉඩම වෙන් කර ඒ සඳහා වන බලපත්‍ර, එවකට අග්‍රාමාත්‍යවරයා විසින් අදාළ පවුල්වලට 2014.10.12 වන දින කිළිනොච්චියේදී ලබා දුන් බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉඩම් කොමසාරිස් ජනරාල්වරයාගේ අංක NP/28/04/03/169 හා 2013.07.02 දිනැති ලිපියට අනුව, සකස් කරන ලද බලපත්‍ර සංඛ්‍යාව කොපමණද;

(ii) එම බලපත්‍රලාභීන්ගේ නම් කවරේද;

(iii) ඔවුන් අතරින් මේ වනවිට බලපත්‍ර ලබාදී ඇති සංඛ්‍යාව කොපමණද;

(iv) ඉහත (iii) හි සඳහන් බලපත්‍රලාභීන් අතරින් මේ වනවිට ඉඩම් ලැබී ඇති බලපත්‍රලාභීන් සංඛ්‍යාව කොපමණද;

(v) මේ වනතෙක් ඉඩම් ලැබී නොමැති බලපත්‍රලාභීන්ට ඉඩම් ලබා දෙන දිනය කවරේද;

(vi) ඉඩම් බලපත්‍ර ලබා දීමේදී ප්‍රමාදයන් ඇති වීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

783/2020

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 1989–1990 කාල සීමාව තුළ රජයේ ගුරු සේවයට බඳවාගනු ලැබූ ගුරුවරුන් සංඛ්‍යාව කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මේ වනවිට එම ගුරුවරුන් විශ්‍රාම යාමේ අවධියට ආසන්නව සිටින බවත්;

(ii) එම ගුරුවරු විශ්‍රාම යැමත් සමඟ ගුරු සේවයේ විශාල පුරප්පාඩු සංඛ්‍යාවක් ඇති වන බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) මෙම තත්ත්වය තුලනය කර ගැනීම සඳහා අමාත්‍යාංශය ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

881/2020

ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා,— ධීවර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාවේ වාර්ෂික මත්ස්‍ය අවශ්‍යතාවය කොපමණද;

(ii) එම අවශ්‍යතාවයෙන් දේශීයව නිෂ්පාදනය කරන ප්‍රමාණය සහ ආනයනය කරන ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) 1982 වර්ෂයේදී උතුරු සහ නැගෙනහිර පළාත්වල මත්ස්‍ය නිෂ්පාදනය, ශ්‍රී ලංකාවේ සමස්ත මත්ස්‍ය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් ලෙස කොපමණද;

(iv) උතුරු සහ නැගෙනහිර පළාත්වල පැවති යුද්මය තත්ත්වය අවසන්ව මේ වනවිට අවුරුදු 11ක් ගත වුවද, 1982 වර්ෂයේදී එම පළාත්වලින් ලද මත්ස්‍ය අස්වැන්න මේ වනවිට නොලැබීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) උතුරු පළාතේ හඳුනාගත් ප්‍රදේශවල මේ වනතෙක් ධීවර වරායන් ඉදිනොකිරීමට හේතු කවරේද;

(ii) පසුගිය වර්ෂ 15ක කාලය තුළ අනෙකුත් පළාත්වල ඉදිකරන ලද ධීවර වරායන් සංඛ්‍යාව කොපමණද;

(iii) පේදුරුතුඩුව ධීවර වරාය ඉදිකිරීමේ ප්‍රගතිය කවරේද;

(iv) මේ සඳහා ආසියානු සංවර්ධන බැංකුවෙන් ලැබුණු ආධාරවල ස්වභාවය සහ එම ආධාර මේ වනවිට නවතා දැමීමට හේතු කවරේද;

(v) නෝර්වේ සහ ඩෙන්මාර්ක් රටවලින් ලබා දෙන ණය මඟින් මෙම වරාය ඉදිකිරීමට හේතු කවරේද;

(vi) එමඟින් ලැබෙන අමතර ප්‍රතිලාභ කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

938/2020

ගරු මුජිබුර් රහුමාන් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පසුගිය රජය විසින් "ළඟම පාසල හොඳම පාසල" නමින් වැඩසටහනක් ක්‍රියාත්මක කළ බවත්;

(ii) ඒ යටතේ කොළඹ අධ්‍යාපන කලාපය තුළ පිහිටි සුසමයවර්ධන විද්‍යාලය, ශාන්ත අන්තෝනි පිරිමි විදුහල, මහාබෝධි විද්‍යාලය, අනුරුද්ධ බාලිකා විදුහල, ශාන්ත අන්තෝනි බාලිකා (ප්‍රාථමික) විදුහල, මුතුවෙල්ල හින්දු විද්‍යාලය සහ මෝදර ආනන්ද විද්‍යාලය යන විද්‍යාල සංවර්ධනය කිරීම ආරම්භ කළ බවත්;

(iii) ඒ සඳහා පසුගිය රජය විසින් මුදල් වෙන් කළ බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම වැඩසටහන යටතේ කොළඹ 12-හමීඩ් අල් හුසෛනි විද්‍යාලයේ ගොඩනැගිල්ලක් ඉදිකිරීමට මුල්ගල තැබූ බව දන්නේද;

(ii) ඒ සම්බන්ධයෙන් ගනු ලබන ඉදිරි පියවර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) මෙම වැඩසටහන යටතේ කොළඹ දිස්ත්‍රික්කයේ සංවර්ධනය කරන ලද පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) ඉහත වැඩසටහන අඛණ්ඩව ක්‍රියාත්මක කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) ඉහත අ(ii)හි සඳහන් පාසල්වල ගොඩනැගිලි ඉදිකිරීම් අවසන් කිරීමට පියවර ගන්නේද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

1670/2021

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කරුවලගස්වැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, සාලියවැව අංක 638 - රණවරාපිටිය ග්‍රාම නිලධාරි වසමේ නීතිවිරෝධී බොරළු කැණීමක් සිදු කරනු ලබන බව දන්නේද;

(ii) එම නීති විරෝධී බොරළු කැණීම මැඩපැවැත්වීම සඳහා අමාත්‍යාංශය විසින් මේ වනවිට ගෙන ඇති සහ ඉදිරියේ දී ගැනීමට අපේක්ෂිත ක්‍රියාමාර්ග වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2021 නොවැම්බර් 16 අඟහරුවාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

274/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) "ආයුර්වේද ශාස්ත්‍රී" පාඨමාලාව හැදෑරීම සඳහා අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් කවරේද;

(ii) එම පාඨමාලාව පවත්වාගෙන යනු ලබන මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද;

(iii) මේ වනවිට එම පාඨමාලාව හදාරනු ලබන සිසුන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එම පාඨමාලාව සඳහා සිසුන් බඳවා ගැනීම මේ වන විට නවතා ඇති බවත්;

(ii) උපාධි පාඨමාලාවකට සමාන මෙම පාඨමාලාවට සිදු කරන ලද සංශෝධන මඟින් ඩිප්ලෝමා පාඨමාලාවක තත්ත්වය දක්වා පහත දමා ඇති බවත්;

(iii) එම පාඨමාලාව නවතා දැමීම සඳහා මේ වනවිට කටයුතු කරමින් සිටින බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) (i) "ආයුර්වේද ශාස්ත්‍රී" පාඨමාලාව උපාධි පාඨමාලාවක තත්වයට නැවත ලබා දීමට රජය කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඉහත සඳහන් උපාධිධාරීන්ට අනෙකුත් ආයුර්වේද වෛද්‍යවරුන්ට හිමි වරප්‍රසාද ලබාදීමට රජය කටයුතු කරන්නේද;

(iii) එම පාඨමාලාව සඳහා සිසුන් බඳවා ගැනීම නැවත ආරම්භ කරන්නේද;

(iv) එම පාඨමාලාව නතර කිරීමට රජය ප්‍රතිපත්තිමය තීරණයක් ගෙන තිබේද;

(v) එසේ නම්, එම දිනය කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

646/2020

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොච්චිපොතාන වැවට ජලය ගෙන යාම සඳහා දෙමට වැව සිට පෝෂක ඇළ මාර්ගයක් ඉදිකර ඇති බවත්;

(ii) මේ හේතුවෙන් එම ඇළ මාර්ගය දෙපස පිහිටා ඇති නිවාස සඳහා ප්‍රවේශ වීමට හරස් මාර්ග ඉදිකිරීමට සිදු වී ඇති බවත්;

(iii) එම ඇළ මාර්ගයේ ජලය ගලා නොබසින අතර එහි ඉදිකිරීම් කටයුතු තවදුරටත් සිදුකළ යුතු බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත ඇළ මාර්ගය ඉදිකිරීමේ ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය කොපමණද;

(ii) එම ව්‍යාපෘතිය අවසන් කිරීම සඳහා දරන ලද මුළු පිරිවැය කොපමණද;

(iii) එම ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු ඉටු වී තිබේද;

(iv) එසේ නම්, මෙම ඇළ මාර්ගය ඔස්සේ මේ වනවිට මුදා හරිනු ලබන ජල ධාරිතාවය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

802/2020

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කිළිනොච්චි දිස්ත්‍රික්කයේ කරච්චි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කිළි/ ඉරාමනාදපුරම් මහා විද්‍යාලය නමින් පාසලක් පිහිටා ඇති බවත්;

(ii) එම පාසල සඳහා නව ශ්‍රවණාගාරයක් ඉදිකිරීමට 2018 වර්ෂයේදී මුල්ගල තැබූ බවත්;

(iii) වෙන් කරන ලද ප්‍රතිපාදන, මුදා නොහැරීම හේතුවෙන් ශ්‍රවණාගාරය ඉදිකිරීම මේ වනවිට නවතා ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම ශ්‍රවණාගාරය ඉදිකිරීම සඳහා ප්‍රතිපාදන වෙන් කරන ලද අමාත්‍යාංශය කවරේද;

(ii) එම ප්‍රතිපාදන, මුදා නොහැරීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉහත සඳහන් ශ්‍රවණාගාරය සම්පූර්ණයෙන්ම ඉදිකර අවසන් කිරීම සඳහා අවශ්‍ය මුදල කොපමණද;

(ii) ඒ සඳහා ප්‍රතිපාදන වෙන් කරනු ලබන දිනය කවරේද;

(iii) එහි ඉදිකිරීම් සම්පූර්ණ කර එය සිසුන්ගේ භාවිතය සඳහා ලබා දීමට ගත වන කාලය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1017/2020

ගරු ප්‍රේමලාල් ජයසේකර මහතා,— මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) "අයි-රෝඩ්" ව්‍යාපෘතිය රත්නපුර දිස්ත්‍රික්කයේ ආරම්භ කරන ලද දිනය කවරේද;

(ii) එම ව්‍යාපෘතිය මඟින් කාපට් අතුරා සංවර්ධනය කිරීමට අනුමත වූ එම දිස්ත්‍රික්කයේ මාර්ගවල දිග කොපමණද;

(iii) එම ව්‍යාපෘතිය යටතේ ගිවිසුම්ගත වූ කොන්ත්‍රාත්කරුවන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත එක් එක් කොන්ත්‍රාත්කරු විසින් සංවර්ධනය කිරීම සඳහා ගිවිසුම්ගත වූ මාර්ගවල නම් හා ඒවායේ දිග;

(ii) එම මාර්ග අතරින් මේ වනවිට සංවර්ධන කටයුතු අවසන් කර ජනතා අයිතියට පත් කර ඇති මාර්ගවල නම් හා ඒවායේ දිග;

(iii) මේ වනවිට වැඩ අවසන් කර නොමැති මාර්ගවල නම් හා ඒවායේ දිග;

වෙන් වෙන් වශයෙන් කවරේද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) වැඩ අවසන් කර නොමැති මාර්ග සංවර්ධනය කිරීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද යන්න තවදුරටත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1403/2021

ගරු සමන්ප්‍රිය හේරත් මහතා,— මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වර්ෂ 2015 සිට 2019 දක්වා වූ කාලය තුළදී මධ්‍යම අධිවේගී මාර්ගයේ ඉදිකිරීම් කටයුතු අවසන් කරන කොටසේ දුර ප්‍රමාණය;

(ii) එම කොටස ඉදිකිරීම සඳහා වැය කරන ලද මුදල;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පෙර පැවති රජය විසින් සැලසුම් කර තිබූ පරිදි මධ්‍යම අධිවේගී මාර්ගයේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කර නොතිබූ බව පිළිගන්නේද;

(ii) එසේ නම්, ඒ සම්බන්ධයෙන් පැහැදිලි කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ජල ගැලීම් සිදු වෙතැයි අපේක්ෂා කරනු ලබන ස්ථානවලදී පෙර සැලසුම් කරන ලද පරිදි කණු මතින් මෙම මාර්ගය ඉදිකරන්නේද;

(ii) සැලසුම් කරන ලද පරිදි මේ වනවිට මෙම මාර්ගයේ ඉදිකිරීම් කටයුතු සිදුකරන්නේද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

## 2021 නොවැම්බර් 17 බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

246/2020

ගරු මොහමඩ් මුසම්මිල් මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 2015 සිට 2019 දක්වා එක් එක් වර්ෂයක් තුළ —

(i) ශ්‍රී ලංකාවට ආනයනය කළ කිරි හා කිරි ආශ්‍රිත නිෂ්පාදන ප්‍රමාණය කොපමණද;

(ii) ඒ සඳහා වැය වූ මුදල කොපමණද;

(iii) එම කිරි හා කිරි ආශ්‍රිත නිෂ්පාදන ආනයනය කළ රටවල් කවරේද;

(iv) එම කිරි හා කිරි ආශ්‍රිත නිෂ්පාදන ආනයනය කළ සමාගම්වල නම් කවරේද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම කාලසීමාව තුළ ශ්‍රී ලංකාවට කිරි හා කිරි ආශ්‍රිත නිෂ්පාදන ආනයනය කිරීම සඳහා වැය වූ මුළු මුදල කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

632/2020

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මඩකළපුව දිස්ත්‍රික්කයේ පිහිටා ඇති කලවංචිකුඩි මූලික රෝහල සහ අම්පාර දිස්ත්‍රික්කයේ පිහිටා ඇති දෙහිඅත්තකණ්ඩිය රෝහල පළාත් අමාත්‍යාංශය යටතේ එකම අවස්ථාවේදී උත්ශ්‍රේණි ගත කරන ලද බවත්;

(ii) ඒ අතරින් දෙහිඅත්තකණ්ඩිය රෝහල මධ්‍යම රජය යටතට පවරා ගැනීමට පියවර ගනිමින් පවතින නමුත් කලවංචිකුඩි රෝහල තවමත් පළාත් අමාත්‍යාංශය යටතේ පවතින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) කලවංචිකුඩි රෝහල මේ වනතෙක් මධ්‍යම රජය යටතට පවරා නොගැනීමට හේතු කවරේද;

(ii) කලවංචිකුඩි රෝහලේ මානව හා භෞතික සම්පත් හිඟයක් පැවතීමට හේතු කවරේද;

(iii) එම හිඟයන් සම්පූර්ණ කිරීමට කඩිනම් පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

735/2020

ගරු ඉෂාක් රහුමාන් මහතා,— විදුලිබල අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මන්නාරම සුළං විදුලි බලාගාරයේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කරන ලද දිනය කවරේද;

(ii) එම බලාගාරය ඉදිකිරීම සඳහා ඇස්තමේන්තුගත මුදල කොපමණද;

(iii) එම බලාගාරයෙන් ප්‍රධාන විදුලි පද්ධතියට එකතු කිරීමට අපේක්ෂිත විදුලි ප්‍රමාණය මෙගා වොට්වලින් කොපමණද;

(iv) එම විදුලි බලාගාරයේ ඉදිකිරීම් කටයුතු අවසන් කිරීමට අපේක්ෂිත දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1086/2020

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා,— විදේශ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සරණාගතයන් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස්ගේ කාර්යාලය (UNHCR) හරහා පාකිස්ථානයේ හා ඇෆ්ගනිස්ථානයේ සිට ශ්‍රී ලංකාවට පැමිණ ඇති සරණාගතයන් සංඛ්‍යාව කොපමණද;

(ii) මේ වනවිට එම සරණාගතයන් රඳවා සිටින ලබන ස්ථාන කවරේද;

(iii) එම සරණාගතයන්ට ලබා දෙනු ලබන පහසුකම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වෙනත් රටවල සරණාගතයන් භාරගැනීම හේතුවෙන් ශ්‍රී ලංකාවේ සමාජයීය හා ආර්ථික ව්‍යුහයට භාරයක් දැරීමට සිදුවන බව පිළිගන්නේද?

(ii) එසේ නම්, මේ සම්බන්ධයෙන් ගනු ලබන පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1280/2020

ගරු කුමාරසිරි රත්නායක මහතා,— වැවිලි අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ වාර්ෂික ගම්මිරිස් අස්වැන්න මෙට්‍රික් ටොන්වලින් කොපමණද;

(ii) ඉහළ ගම්මිරිස් අස්වැන්නක් ලබන දිස්ත්‍රික්ක කවරේද;

(iii) එම එක් එක් දිස්ත්‍රික්කයේ වාර්ෂික ගම්මිරිස් අස්වැන්න මෙට්‍රික් ටොන්වලින් වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ගම්මිරිස් හැර වෙනත් කුළුබඩු වර්ග ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලබන්නේද;

(ii) එසේ නම්, ඒවා කවරේද;

(iii) එම එක් එක් කුළුබඩු වර්ගයේ වාර්ෂික අවශ්‍යතාවය සහ ආනයනය කරනු ලබන ප්‍රමාණය මෙට්‍රික් ටොන්වලින් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ආනයනය කරනු ලබන කුළුබඩු වර්ගවල දේශීය නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2021 නොවැම්බර් 19 සිකුරාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

312/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— විදුලිබල අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වර්ෂ 2015 සිට 2020 දක්වා පුනර්ජනනීය බලශක්තිය සම්බන්ධයෙන් අමාත්‍යාංශය වෙත ලැබී ඇති ව්‍යාපෘති සංඛ්‍යාව කොපමණද;

(ii) එම ව්‍යාපෘති අතරින් අනුමත කරන ලද ව්‍යාපෘති සංඛ්‍යාව කොපමණද;

(iii) ඒවායේ නම් කවරේද;

(iv) අනුමත කරන ලද ව්‍යාපෘති අතරින් මේ වනවිට වැඩ ආරම්භ කර ඇති හා වැඩ ආරම්භ කර නොමැති ව්‍යාපෘති වෙන් වෙන් වශයෙන් කවරේද?

(v) මේ වනවිට වැඩ ආරම්භ කර නොමැති ව්‍යාපෘති කඩිනමින් ආරම්භ කිරීමට අමාත්‍යාංශය විසින් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

583/2020

ගරු වේලු කුමාර් මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මහනුවර දිස්ත්‍රික්කයේ, දෙල්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටා ඇති ජනතා වතු සංවර්ධන මණ්ඩලයට අයත් බෝපිටිය වත්තේ කොටසක් ලෙස මාවුසා කොටස පවතින බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් මාවුසා කොටසට අයත් වන භූමි ප්‍රමාණය හෙක්ටයාර්වලින්;

(ii) ඒ අතරින්, මේ වනවිට වගා කර ඇති භූමි ප්‍රමාණය;

(iii) ඉහත (i) හි සඳහන් භූමි ප්‍රමාණයෙන් මේ වනවිට වගා නොකර අත්හැර දමා ඇති භූමි ප්‍රමාණය;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉහත සඳහන් බෝපිටිය වත්තේ මාවුසා කොටසේ පිහිටා ඇති ලයින් නිවාස සංඛ්‍යාව සහ එහි ඇති ලයින් කාමර සංඛ්‍යාව;

(ii) එම නිවාසවල පදිංචිව සිටින පවුල් සංඛ්‍යාව;

කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) (i) ඉහත ලයින් නිවාසවල පදිංචිව සිටින පවුල් සඳහා තනි නිවාස ඉදිකිරීමට ඉඩම් ලබා දී තිබේද;

(ii) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

990/2020

ගරු රෝහණ බංඩාර මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2020 වර්ෂයේ ශ්‍රී ලංකාවේ දේශීය ලොකු ලූනු නිෂ්පාදනය කොපමණද;

(ii) එම ප්‍රමාණය එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම ලොකු ලූනු නිෂ්පාදනය මිලදී ගැනීම සඳහා සකස් කර ඇති ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1431/2021

ගරු උද්දික ප්‍රේමරත්න මහතා,— සංචාරක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ හබරණ නගරය කේන්ද්‍ර කර ගනිමින් සංචාරක කලාපයක් ස්ථාපිත කර ඇති බව දන්නේද;

(ii) එම කලාපයට අයත් වනාන්තර සහ එම කලාපය තුළ සැරිසරන වන අලින් ආරක්ෂා වන ආකාරයෙන් එම සංචාරක කලාපයේ භෞතික සංවර්ධන කටයුතු සිදු කිරීම සඳහා ශක්‍යතා අධ්‍යයනයක් සිදු කර තිබේද;

(iii) එවැනි අධ්‍යයනයක් තුළින් විධිමත් හා විද්‍යානුකූල ලෙස දියුණු කරන ලද සංචාරක කලාපයක් ලෙස හබරණ නගරය සංවර්ධනය කිරීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක වන්නේද;

(iv) එම වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා අදාළ සැලසුම් සකස් කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1734/2021

ගරු ගුණතිලක රාජපක්ෂ මහතා,— ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015-2019 කාලය තුළ ශ්‍රී ලංකාවේ ප්‍රසිද්ධ මෝටර් රථ ධාවන ශූරයෙකු, ඔහු විසින්ම මුදල් ගෙවා ස්වාධීන රූපවාහිනිය මඟින් විකාශය කරන ලද වැඩසටහනේ නම කවරේද;

(ii) පසුව එම වැඩසටහන් මාලාව වෙනුවෙන් ස්වාධීන රූපවාහිනී සේවය මඟින් ඉහත සඳහන් පුද්ගලයාට මුදල් ගෙවා තිබේද;

(iii) එසේ නම්, එම එක් වැඩසටහනක් වෙනුවෙන් ගෙවන ලද මුදල සහ සියලු වැඩසටහන් වෙනුවෙන් ගෙවන ලද මුළු මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත කාලය තුළ "අනෝමාස් කිවන්" නැමැති වැඩසටහන, ස්වාධීන රූපවාහිනිය ඔස්සේ විකාශය කිරීම වෙනුවෙන් මුදල් ගෙවා ඇති බව පිළිගන්නේද;

(ii) එසේ නම්, එම මුදල කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉහත (අ) (i) සහ (ආ) (i) හි සඳහන් කරන ලද වැඩසටහන් දෙක සඳහා මුදල් ගෙවීම සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන්ගේ නම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එම මුදල, ඉහත නිලධාරීන්ගෙන් අයකර ගැනීමට කටයුතු කරන්නේද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

## 2021 නොවැම්බර් 20 සෙනසුරාදා
# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

731/2020

ගරු කේ.පී.එස්. කුමාරසිරි මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාවේ ව්‍යාප්ත වන ඩෙංගු උවදුර මර්දනයට රජය විසින් විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබන බවත්;

(ii) අනුරාධපුරය හා පොළොන්නරුව වැනි දිස්ත්‍රික්කවල පවතින වියළි කාලගුණය අවසන්ව නැවත වැසි ලැබීමත් සමග මදුරු ගහනය වර්ධනය වන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාවේ මේ වනතෙක් ඩෙංගු රෝගයට ගොදුරුවූවන්ගේ සංඛ්‍යාව කොපමණද;

(ii) ඩෙංගු උවදුර මර්දනයට රජය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) ඩෙංගු මදුරු කීටයන් විනාශ කිරීමට 2008/2009 වකවානුවේදී එවකට පැවති රජය විසින් B.T.I. බැක්ටීරියාව කියුබාවෙන් ආනයනය කිරීමට විවිධ උත්සාහයන් ගත් නමුත් එය අසාර්ථක වූ බවත් එතුමා දන්නෙහිද?

(ඈ) (i) ශ්‍රී ලංකාවේ ඩෙංගු මදුරුවන් මර්දනය කිරීම සඳහා B.T.I. බැක්ටීරියාව භාවිතා කිරීමට ඇති හැකියාව සම්බන්ධයෙන් පර්යේෂණයක් සිදු කර තිබේද;

(ii) ශ්‍රී ලංකාවේ ඩෙංගු මදුරුවන් මර්දනය කිරීම සඳහා B.T.I. බැක්ටීරියාව භාවිතා කිරීමට හැකියාවක් නොමැති නම්, එයට හේතු කවරේද;

(iii) B.T.I. බැක්ටීරියාව වෙනුවට ඩෙංගු මදුරුවන් මර්දනයට භාවිතා කළ හැකි විකල්පය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

933/2020

ගරු චාල්ස් නිර්මලනාදන් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) යාපනය, කිලිනොච්චිය, මුලතිව්, මන්නාරම සහ වවුනියාව යන දිස්ත්‍රික්ක පහේ සිටින විශේෂ අවශ්‍යතා සහිත සිසුන් සංඛ්‍යාව එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම සිසුන්ට අවශ්‍යවන විශේෂ අවශ්‍යතා කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම සිසුන් සඳහා මේ වනවිට පාසල්වල පවතින භෞතික සම්පත් සහ කාර්ය මණ්ඩලය ප්‍රමාණවත් නොවන බවත් එතුමා දන්නෙහිද?

(ඇ) උතුරු පළාතට අයත් අධ්‍යාපන කලාප 12 සඳහා විශේෂ අවශ්‍යතා ඇති සිසුන් වෙනුවෙන් එක් අධ්‍යාපන කලාපයකට එක් ගොඩනැගිල්ලක් බැගින් නවීන පහසුකම් සහිත ගොඩනැගිලි ඉදිකිරීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නේහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1102/2020

ගරු ජේ.සී. අලවතුවල මහතා,— වැවිලි අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සුළු අපනයන බෝග වගාකරුවන් අතර ශ්‍රී ලංකාවට වැඩි වශයෙන් විදේශ විනිමය උපයා දෙනු ලබන කරදමුංගු, කරාබු නැටි සහ ගම්මිරිස් වගාකරුවන් සිටින බවත්;

(ii) කරදමුංගු, කරාබු නැටි සහ ගම්මිරිස් යන සුළු අපනයන බෝගවල ගැනුම් මිල පහත වැටෙන අවස්ථාවලදී එම වගාකරුවන්ට අසාධාරණයක් සිදු වන බවත්;

(iii) ගැනුම් මිල පහත වැටෙන අවස්ථාවලදී, කරදමුංගු, කරාබු නැටි සහ ගම්මිරිස් වගාකරුවන් එම සුළු අපනයන බෝග වගා කිරීමෙන් ඉවත් වන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ගැනුම් මිල පහත වැටෙන අවස්ථාවලදී, කරදමුංගු, කරාබු නැටි සහ ගම්මිරිස් වගාකරුවන් සඳහා සහනාධාර මුදලක් ලබා දීමට කටයුතු කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2031/2021

ගරු තිස්ස අත්තනායක මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමියගෙන්ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද වැටුප් ක්‍රමය 2018.10.01 වන දින සිට එම මණ්ඩලයේ සමස්ත සේවක පිරිසෙන් බහුතරයකට පමණක් ක්‍රියාත්මක වන බවත්;

(ii) විධායක සහ ලිපිකරු හා සමාන්තර ශ්‍රේණිවල සේවය කරනු ලබන අනෙකුත් නිලධාරින් සඳහා 2018.10.01 දින සිට මේ දක්වා ඉහත සඳහන් වැටුප් ක්‍රමය ක්‍රියාත්මක නොවන බවත්;

(iii) ඒ හේතුවෙන් එම නිලධාරින්ට අසාධාරණයක් සිදු වී ඇති බවත්;

එතුමිය පිළිගන්නෙහිද;

(ආ) (i) විධායක සහ ලිපිකරු හා සමාන්තර ශ්‍රේණිවල නිලධාරින් සඳහා ඉහත සඳහන් වැටුප් ක්‍රමය ක්‍රියාත්මක කිරීම මඟින් ඔවුන්ට සාධාරණයක් ඉටු කිරීමට පියවර ගන්නේද;

(ii) එම නිලධාරින් සඳහා ඉහත සඳහන් වැටුප් ක්‍රමය 2018.10.01 දින සිට බලපැවැත්වෙන පරිදි ක්‍රියාත්මක කිරීමට පියවර ගන්නේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2177/2021

ගරු ගාමිණී වලේබොඩ මහතා,—වැවිලි අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට 2019 දක්වා වැවිලි කර්මාන්ත විෂයභාර අමාත්‍යවරයා ලෙස කටයුතු කරන ලද එක් එක් අමාත්‍යවරයාගේ නම හා ධූර කාලය වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) ඉහත එක් එක් අමාත්‍යවරයා විසින් සිය ධූර කාලය තුළ පත් කරන ලද උපදේශකවරුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම එක් එක් උපදේශකවරයාගේ නම, වයස, අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එක් එක් උපදේශකවරයා සඳහා ගෙවන ලද මාසික වැටුප, දීමනා සහ ලබා දී තිබූ වෙනත් පහසුකම් කවරේද;

(v) එම එක් එක් උපදේශකවරයා වෙත පවරා දී තිබූ වගකීම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(vi) එම එක් එක් උපදේශකවරයා නිරත වී ඇති විදේශ සංචාර, එම විදේශ සංචාරවල නිරත වීම සඳහා හේතු වූ කරුණු, ඒ සඳහා දරන ලද වියදම් හා එමඟින් අමාත්‍යාංශයට අත් වූ ප්‍රතිලාභ වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2021 නොවැම්බර් 22 සඳුදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

177/2020

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) ශ්‍රී ලංකාවේ ප්‍රධානතම රෝහලක් වන දකුණු කොළඹ ශික්ෂණ රෝහල් පරිශ්‍රයේ ඉදිකරමින් පවතින මහල් 13කින් සමන්විත වාට්ටු සංකීර්ණයේ ඉදිකිරීම් කටයුතු ඉතා මන්දගාමීව සිදු කරනු ලබන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම වාට්ටු සංකීර්ණය ඉදිකිරීම සඳහා ඇස්තමේන්තුගත පිරිවැය කොපමණද;

(ii) ඊට අදාළ කොන්ත්‍රාත්තුව ලබා ගත් ආයතනයේ නම කවරේද;

(iii) එම ඉදිකිරීම් කටයුතු නිම කිරීමට අපේක්ෂා කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

313/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මන්නාරම් ද්‍රෝණිය අසළ විශාල ඛනිජ තෙල් නිධියක් පවතින බවට සනාථ කර ගනු ලැබූ වර්ෂය කවරේද;

(ii) එම නිධිය සම්බන්ධයෙන් පර්යේෂණ කිරීම, ආරම්භ කරන ලද දිනය කවරේද;

(iii) එම පර්යේෂණ කිරීම සඳහා භාර දෙන ලද ආයතනවල හා සංවිධානවල නම් කවරේද;

(iv) අදාළ පර්යේෂණ කිරීම සඳහා මේ වනතෙක් වැය කරන ලද මුදල කොපමණද;

(v) එම ඛනිජ තෙල් සහ ගෑස් නිධියෙන් උපරිම ප්‍රයෝජන ගැනීම සම්බන්ධයෙන් මේ වනතෙක් අමාත්‍යාංශය විසින් ගනු ලැබූ සහ ඉදිරියේදී ගනු ලබන ක්‍රියාමාර්ග වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

506/2020

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කුරුණෑගල දිස්ත්‍රික්කයේ පිහිටා ඇති ගම්මාන අතරින් පිරිසිදු පානීය ජලය සපයා ගැනීමේ ගැටලුවට මුහුණ දී ඇති ගම්මාන සංඛ්‍යාව කොපමණද;

(ii) එම දිස්ත්‍රික්කය තුළ මේ වනවිට ක්‍රියාත්මක වන ප්‍රජා මූල ජල සම්පාදන ව්‍යාපෘති සංඛ්‍යාව කොපමණද;

(iii) ඒවායේ නම් කවරේද;

(iv) ඉහත සඳහන් එක් එක් ව්‍යාපෘතිය මඟින් ආවරණය වන ගම්මාන සංඛ්‍යාව හා පවුල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත සඳහන් ප්‍රජා මූල ජල සම්පාදන ව්‍යාපෘතිවල පවතින ධාරිතාවය තවදුරටත් වැඩි කිරීමට ගනු ලබන පියවර කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1735/2021

ගරු ගුණතිලක රාජපක්ෂ මහතා,— ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 2015 සිට 2019 දක්වා වූ කාලය තුළ ස්වාධීන රූපවාහිනී සේවයේ සහ ලක්හඬ ගුවන් විදුලියේ නව ලාංඡන ප්‍රවර්ධනය කිරීම වෙනුවෙන් වැය කරන ලද මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වර්ෂ 2015 සිට 2019 දක්වා වූ කාලය තුළ ස්වාධීන රූපවාහිනී සේවය සහ ලක්හඬ ගුවන් විදුලිය සඳහා බඳවාගන්නා ලද උපදේශකවරුන් සංඛ්‍යාව;

(ii) එම එක් එක් උපදේශකවරයාගේ නම, අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්, ගෙවන ලද මාසික වැටුප, දීමනා හා ලබා දෙන ලද වෙනත් පහසුකම් සහ එම එක් එක් උපදේශකවරයාට ගෙවන ලද සම්පූර්ණ මුදල;

වෙන් වෙන් වශයෙන් කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) ඉහත උපදේශකවරුන්ගෙන් ස්වාධීන රූපවාහිනී සේවයට සහ ලක්හඬ ගුවන් විදුලියට ලබාදෙන ලද සේවය කවරේද යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1794/2021

ගරු රෝහණ දිසානායක මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ඇති රාජ්‍ය විශ්වවිද්‍යාල සංඛ්‍යාව කොපමණද;

(ii) එම විශ්වවිද්‍යාලවලට අනුබද්ධව ස්ථාපිත කර ඇති කෘෂි විද්‍යා පීඨ සංඛ්‍යාව කොපමණද;

(iii) එම කෘෂි විද්‍යා පීඨ ස්ථාපිත කර ඇති විශ්වවිද්‍යාලවල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) කෘෂිකර්මාන්තය සඳහාම වෙන් වූ විශ්වවිද්‍යාලයක් තිබේද;

(ii) නොඑසේ නම්, කෘෂිකර්මාන්තය සඳහා වෙන් වූ විශ්වවිද්‍යාලයක් ස්ථාපිත කිරීමට අදහස් කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

**2021 නොවැම්බර් 23 අඟහරුවාදා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

459/2020

ගරු මොහමඩ් මුසම්මිල් මහතා,— බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ලීටර් 13,200ක ඉන්ධන ප්‍රවාහන ධාරිතාවයකින් යුත් ටැංකි සහිත රථ 05ක් මිලදී ගැනීම සඳහා 2016 වර්ෂයේදී අමාත්‍යාංශය විසින් ටෙන්ඩර් කැඳවීමක් සිදු කරනු ලැබුවේද;

(ii) එසේ නම්, එම ටෙන්ඩරය කැඳවනු ලැබුවේ කවුරුන් විසින්ද;

(iii) එම ටෙන්ඩරය එවකට අදාළ අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව වෙත යොමු කරනු ලැබුවේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම රථ 05 මිලදී ගැනීම සඳහා වැය කරන ලද මුළු මුදල;

(ii) එක් රථයක් මිලදී ගැනීම සඳහා වැය කරන ලද මුදල;

(iii) එම රථ මිලදී ගන්නා අවස්ථාව වනවිට එක් රථයක වෙළඳපොළ වටිනාකම;

කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

713/2020

ගරු මයන්ත දිසානායක මහතා,— කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට ශ්‍රී ලංකාව තුළ පිහිටා ඇති රජය සතු අත්යන්ත්‍ර පේෂ කර්මාන්ත මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා පිහිටා ඇති ප්‍රදේශ කවරේද;

(iii) මේ වනවිට එම මධ්‍යස්ථානවලින් නිෂ්පාදනය කරනු ලබන දේශීය රෙදිපිළි වර්ග කවරේද;

(iv) අත්යන්ත්‍ර පේෂ කර්මාන්තය සඳහා රජයෙන් ලබා දී ඇති සහන කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම නිෂ්පාදන විදේශ වෙළඳපොළට අලෙවි කරන්නේද;

(ii) එසේ නම්, එම රටවල් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

840/2020

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා,— කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මඩකළපුව දිස්ත්‍රික්කය, අත්යන්ත්‍ර පේෂ කර්මාන්තය සඳහා ප්‍රසිද්ධියක් උසුලන බවත්;

(ii) අත්යන්ත්‍ර පේෂ කර්මාන්තය තුළින් වැඩි වශයෙන් ආයෝජන අවස්ථා ලබා ගත හැකි බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මඩකළපුව දිස්ත්‍රික්කයේ අත්‍යන්ත්‍ර පේෂ කර්මාන්ත ශාලා කිහිපයක් ඉදිකිරීමට පියවර ගන්නේද;

(ii) ඉහත අ(ii)හි සඳහන් ආයෝජන අවස්ථා සෘජුවම කර්මාන්තයේ නියැලෙන්නන්ට ලබාදීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1647/2021

ගරු මුජිබුර් රහුමාන් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2020 වර්ෂයේදී කොළඹ දිස්ත්‍රික්කයේ වතු ආශ්‍රිතව හඳුනාගත් ඩෙංගු රෝගීන් සංඛ්‍යාව කොපමණද;

(ii) එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව එම සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) කොළඹ දිස්ත්‍රික්කයේ වතු ආශ්‍රිතව පැතිරෙමින් පවතින ඩෙංගු රෝගය මැඩපැවැත්වීම සඳහා මේ වනවිට ගෙන ඇති විශේෂ ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1830/2021

ගරු චාමර සම්පත් දසනායක මහතා,— රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් සඳහා ගෙවනු ලබන මාසික වැටුපට අමතරව පසුගිය රජයේ ආණ්ඩු පාර්ශ්වය නියෝජනය කරන ලද පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් සඳහා 2017 සහ 2018 වර්ෂවලදී දීමනාවක් ගෙවා තිබේද;

(ii) එසේ නම්, එම දීමනාව කොපමණද;

(iii) එම ගෙවීම සඳහා නීත්‍යානුකූල පදනමක් තිබේද;

(iv) ඉහත දීමනාව ගෙවන ලද අමාත්‍යාංශයේ/කාර්යාලයේ නම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වර්තමාන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් සඳහා ඉහත දීමනාව ගෙවීමට හැකියාවක් තිබේද;

(ii) එසේ නම්, ඒ සම්බන්ධයෙන් මේ වනවිට ක්‍රියාමාර්ගයක් ගෙන තිබේද;

(iii) නොඑසේ නම්, ඒ සම්බන්ධයෙන් ඉදිරියේදී ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2021 නොවැම්බර් 24 බදාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

74/2020

ගරු හේෂා විතානගේ මහතා,— අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රේෂ්ඨාධිකරණයට යොමු වී ඇති නමුත් මේ වනතෙක් තීන්දුවක් ලබා දී නොමැති මානව හිමිකම් නඩු සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් නඩුව ශ්‍රේෂ්ඨාධිකරණයට යොමු වූ දිනය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම එක් එක් නඩුවට අදාළ නඩු අංකය සහ පැමිණිලිකරුවන් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

742/2020

ගරු ඉෂාක් රහුමාන් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ පිහිටා ඇති විහාරස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) දිස්ත්‍රික්කයේ දුෂ්කර ගම්මානවල පිහිටා ඇති විහාරස්ථානවල විශාල වශයෙන් අඩුපාඩු පවතින බව පිළිගන්නේද;

(iii) එම විහාරස්ථාන සංවර්ධනය කිරීමට පියවර ගෙන තිබේද;

(iv) එසේ නම්, ඒ සඳහා මේ වනවිට මුදල් වෙන් කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යා ස්ථාන විනාශ කිරීමට එරෙහිව ගැනීමට අපේක්ෂිත ක්‍රියාමාර්ග කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1404/2021

ගරු සමන්ප්‍රිය හේරත් මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාවේ පවතින දේශීය වී ප්‍රභේදවල නම්;

(ii) ශ්‍රී ලංකාවට පමණක් ආවේනික වූ දේශීය වී ප්‍රභේදවල නම්;

වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පැරණි වී ප්‍රභේද වර්ග වගා කිරීම සඳහා පොහොර සහ කෘෂි රසායන ද්‍රව්‍ය අවශ්‍ය නොවන බව දන්නේද;

(ii) පැරණි වී ප්‍රභේද වර්ග සංරක්ෂණය කිරීමට සහ වගා කිරීමට ගෙන ඇති වැඩපිළිවෙළ කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) මේ වනවිට ශ්‍රී ලංකාවේ වකුගඩු හා පිළිකා රෝග බහුලව පවතින බවත් එතුමා දන්නෙහිද?

(ඈ) ජාන විකෘති කළ නිෂ්පාදිත, ශ්‍රී ලංකාවට ආවේනික නොවූ වී සහ බීජ වර්ගවලින් නිෂ්පාදන කරන ලද ආහාර භාවිතා කිරීම ප්‍රධාන වශයෙන් මෙයට හේතු වී ඇති බව පර්යේෂණ මඟින් තහවුරු වී තිබේද යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

1421/2021

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ප්‍රථම 'සුහුරු පන්ති කාමර' නියමු ව්‍යාපෘතිය 2017.01.13 දින කෝට්ටේ ශ්‍රී ජයවර්ධනපුර (පිරිමි) විද්‍යාලයේදී ආරම්භ කරන ලද බවත්;

(ii) එතැන් සිට මෙම නියමු ව්‍යාපෘතිය පුළුල් කිරීම සඳහා අරමුදල් වෙන් කරන ලද බවත්;

(iii) එම පාසලෙහි ශ්‍රේණි සියල්ලෙහි ම 'සුහුරු පන්ති කාමර' ස්ථාපිත කිරීමට හැකි වූ බවත්;

(iv) අනෙකුත් පාසල් සහ රාජ්‍ය ආයතන මෙම වැඩසටහනෙහි ප්‍රතිඵල ඇගයීම් කර තිබෙන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් කළ පාසලේ 'සුහුරු පන්ති කාමර' සඳහා ඇතුළත් වූ ශ්‍රේණි, පන්ති සහ සිසුන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එම පාසලේ 'සුහුරු පන්ති කාමර' පුළුල් කිරීම සඳහා ඇති සැලසුම් කවරේද;

(iii) මෙම වැඩසටහන සඳහා වෙන් කිරීමට නියමිත මුදල් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) ඉහත සඳහන් පාසල ජාතික පාසලක් දක්වා උසස් කර, 2022 වර්ෂයේ දී එම පාසල එහි 200 වැනි සංවත්සරය සමරන අවස්ථාවේදී එය ශ්‍රී ලංකාවේ ප්‍රථම සුහුරු පාසල බවට පත් කළ හැකිද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නො එසේ නම්, ඒ මන්ද?

2265/2021

ගරු වසන්ත යාපාබණ්ඩාර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) යටිනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ගිරාගම ප්‍රදේශයේ සෞන්දර්ය අධ්‍යාපන ගුරු අභ්‍යාස විද්‍යාලයක් තිබේද;

(ii) එසේ නම්, එම විද්‍යාලයට අයිති ඉඩම් ප්‍රමාණය හා ගොඩනැගිලි සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) මීට අවුරුදු 20කට පෙර එම විද්‍යාලයේ ඉගෙනුම ලැබූ ගුරු සිසුන් සංඛ්‍යාව කොපමණද;

(iv) මේ වනවිට එම විද්‍යාලයේ ඉගෙනුම ලබන ගුරු සිසුන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මේ වනවිට එම විද්‍යාලය භාවිතයට නොගන්නා තත්ත්වයට පත්වී ඇති බව දන්නේද;

(ii) එසේ නම්, එහි පාසලක් ස්ථාපිත කිරීමට කටයුතු කරන්නේද;

(iii) නොඑසේ නම්, එම භූමිය සහ ගොඩනැගිලි තවදුරටත් අත්හැර දමන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2021 නොවැම්බර් 25 බ්‍රහස්පතින්දා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

647/2020

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කන්තලේ සහ කවුඩුල්ල ජලාශ වෙත ජලය සැපයීමකින් තොරව ඉහළ ඇලහැර වේල්ල හරහා ජලය ගෙන යාමට සැලසුම්කර ඇති බවත්;

(ii) ජනරංජන වැවට ආසන්නයෙන් මහවැලි ගඟෙහි ජලය පොම්ප කිරීමෙන් මොරගහකන්ද ජලාශයේ ජලය කන්තලේ හා කවුඩුල්ල ජලාශ වෙත යොමු කරන බවත්;

(iii) කන්තලේ හා කවුඩුල්ල ජලාශ මීටර් 25ක් පමණ උසින් හා පොම්පාගාරයේ සිට කි.මී. 60ක් පමණ දුරකින් පිහිටීම හේතුවෙන් එම ජලාශ මඟින් පෝෂණය කරනු ලබන අක්කර 2500 පමණ වගාබිම් වෙත ජලය පොම්ප කිරීම සඳහා වාර්ෂිකව රු.මි. 600ක් පමණ වැය වන බවත්;

(iv) වැමැඩිල්ල ජලාශයේ සිට වයඹ පළාත දක්වා වූ පෝෂක ඇළ ඉදිකිරීමේ ව්‍යාපෘතියේ ප්‍රමාදයක් පවතින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත පෝෂක ඇළේ ජලය අපේක්ෂිත මට්ටමට ලඟා වන බවට සහතික වන්නේද;

(ii) නොඑසේ නම්, ඇදුරු ඔය ජලාශ ව්‍යාපෘතිය මෙන් මෙම ව්‍යාපෘතිය ද අවසන් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

768/2020

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මධ්‍යම අධිවේගී මාර්ගය ශ්‍රී ලංකාවට අත්‍යවශ්‍ය මාර්ගයක් බව එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) එම මාර්ගයේ පළමු අදියරේ සහ දෙවන අදියරේ වැඩ අවසන් කර තිබේද;

(ii) නොඑසේ නම්, එම එක් එක් අදියරේ වැඩ අවසන් කරනු ලබන දිනය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම මාර්ගයේ තෙවන අදියරේ වැඩ ආරම්භ කරනු ලබන දිනය කවරේද;

(iv) එම මාර්ගයේ තෙවන අදියරේ වැඩ කටයුතු සඳහා මුදල් වෙන් කිරීමට පියවර ගෙන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

793/2020

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ රජයේ පාසල්වල ඉගෙනුම ලබන මුළු පාසල් ශිෂ්‍ය-ශිෂ්‍යාවන් සංඛ්‍යාව කොපමණද;

(ii) මේ වනවිට රජයේ පාසල්වල සේවය කරනු ලබන ගුරුවරුන් සංඛ්‍යාව කොපමණද;

(iii) ශ්‍රී ලංකාවේ ගුරු-සිසු අනුපාතය කොපමණද;

(iv) ගුරු තුලනයක් ඇතිවන පරිදි ගුරු ස්ථාන මාරු ප්‍රතිපත්තිය නිසි ලෙස ක්‍රියාත්මක කිරීමට අමාත්‍යාංශය විසින් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1401/2021

ගරු ඩබ්ලිව්.එච්.එම්. ධර්මසේන මහතා,— වැවිලි අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වඳුරන්, රිලවුන් සහ දඬු ලේනන් ආදී සතුන්ගෙන් පොල් වගාවට සිදු වන හානි, පොල් මිල ඉහළ යාමට ප්‍රබල ලෙස බලපා ඇති බවත්;

(ii) රිලවුන් ගහනය සීඝ්‍ර ලෙස ව්‍යාප්ත වීම හේතුවෙන් දකුණු සහ ඌව පළාත්වල ගෙවතු ආශ්‍රිත පොල් වගාකරුවන් දැඩි දුෂ්කරතාවයට පත් වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ඉහත තත්ත්වය පාලනය කිරීමට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) මෙම සතුන්ගේ ගහනය පාලනය කිරීම සඳහා —

(i) වන්ධ්‍යාකරණ ක්‍රමවේදය භාවිතා කළ නොහැකිද;

(ii) ආහාර සමඟ මිශ්‍ර කරන ලද හෝමෝන ප්‍රතිකර්ම ක්‍රමය භාවිතා කිරීම සම්බන්ධයෙන් අවධානය යොමු කර තිබේද;

(iii) වායු තුවක්කු භාවිතයෙන් එන්නත්කරණය සිදු කිරීම සම්බන්ධව අත්හදා බැලීම් සිදු කර තිබේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1918/2021

ගරු (මේජර්) ප්‍රදීප් උඳුගොඩ මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට 2019 දක්වා සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ යම් අක්‍රමිකතාවයක්, අයථා පත්වීමක්, දූෂණ ක්‍රියාවක් හෝ නීති විරෝධී ක්‍රියාවක් සිදු වී තිබේද;

(ii) එසේ නම්, ඒවා වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත සඳහන් එක් එක් කරුණ හේතුවෙන් රජයට අහිමි වී ඇති මූල්‍ය, දේපළ හා මානව සම්පත්වල වටිනාකම වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත (අ) (i) හි සඳහන් ක්‍රියාවන්ට වගකිව යුතු නිලධාරින් හඳුනාගැනීමට විමර්ශන සිදු කර තිබේද;

(ii) වගකිව යුතු නිලධාරින් හඳුනාගෙන ඇත්නම්, ඔවුන්ට එරෙහිව ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iii) ඔවුන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගෙන නොමැති නම්, ඊට හේතු කවරේද;

(iv) ඉදිරියේදී ඔවුන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගනු ලබන්නේද;

(v) ඉදිරියේදී සිදු විය හැකි මෙවැනි ක්‍රියාවන් වැළැක්වීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

**2021 නොවැම්බර් 26 සිකුරාදා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

276/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2018 හා 2019 වර්ෂවල ශ්‍රී ලංකාවේ කෙසෙල් නිෂ්පාදනය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) කෙසෙල් නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා ක්‍රියාමාර්ග ගෙන තිබේද;

(iii) එසේ නම්, එම ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාවේ ඇති කෙසෙල් ප්‍රභේද සංඛ්‍යාව කොපමණද;

(ii) කෙසෙල් වගාව සඳහා සුදුසු දේශගුණ තත්ත්වයක් ඇති ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්කවල නම් කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ශ්‍රී ලංකාව කෙසෙල් ආනයනය කරන්නේද;

(ii) එසේ නම්, 2018 හා 2019 වර්ෂවලදී කෙසෙල් ආනයනය කිරීම සඳහා වැය කරන ලද මුදල එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ශ්‍රී ලංකාව කෙසෙල් අපනයනය කරන්නේද;

(iv) එසේ නම්, 2018 හා 2019 වර්ෂවලදී කෙසෙල් අපනයන කිරීමෙන් ලැබූ ආදායම එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න තවදුරටත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

804/2020

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා,— රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) කිළිනොච්චි දිස්ත්‍රික්කය සඳහා මේ වනතෙක් ප්‍රධාන බස් නැවතුම් පොළක් නොමැති බව එතුමා දන්නෙහිද?

(ආ) කිළිනොච්චි ප්‍රධාන බස් නැවතුම් පොළ —

(i) ඉදිකිරීම් කටයුතු ආරම්භ කරන ලද දිනය කවරේද;

(ii) ඉදිකිරීම් කටයුතු අතරමග නතර කිරීමට හේතු කවරේද;

(iii) ඉදිකිරීම සඳහා වෙන් කරන ලද මුදල කොපමණද;

(iv) ඉදිකිරීම සඳහා වෙන් කරන ලද මුදලින් මේ වනතෙක් භාවිතා කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත බස් නැවතුම්පොළ ඉදිකිරීම් නැවත ආරම්භ කිරීම සඳහා නාගරික සංවර්ධන අධිකාරියට වෙන් කරන ලද ප්‍රතිපාදනය කොපමණද;

(ii) එම ප්‍රතිපාදනයට අදාළව වැඩ කටයුතු ආරම්භ කරනු ලබන දිනය කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) (i) ඉහත බස් නැවතුම්පොළ ඉදිකිරීම, කරච්චි ප්‍රාදේශීය සභාවේ අනාගත සැලසුම්වලට අනුකූල වන්නේද;

(ii) එසේ නම්, බස් නැවතුම් පොළ ඉදිකිරීමට සමගාමීව පාර පුළුල් කිරීම, වටරවුම ඉදිකිරීම සහ සාප්පු සංකීර්ණය ඉදිකිරීම වැනි යොජනා ක්‍රියාත්මක කරන්නේද;

යන්න තවදුරටත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේනම්, ඒ මන්ද?

1394/2021

ගරු දිලිප් වෙදආරච්චි මහතා,— වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සීමාසහිත තංගල්ල විවිධ සේවා සමුපකාර සමිතියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන් දොළොස් දෙනෙකුගෙන් සමන්විත වුවද, එම සමිතියේ බලය අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් තිදෙනෙකු විසින් බලහත්කාරයෙන් අත්පත් කර ගෙන තිබෙන බවත්;

(ii) තංගල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අනුයුක්තව සේවය කරනු ලබන සමෘද්ධි සංවර්ධන නිලධාරියෙකු මෙයට සම්බන්ධ වී සිටින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මේ සම්බන්ධයෙන් පොලිස් විමර්ශනයක් සිදු කර තිබේද;

(ii) පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස් (දකුණු පළාත) විසින් මේ සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iii) සීමාසහිත තංගල්ල විවිධ සේවා සමුපකාර සමිතියේ සාමාජිකයන්ගේ සහ එහි ගනුදෙනුකරුවන්ගේ මුදල් වලට වගකියනු ලබන පාර්ශ්වය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1737/2021

ගරු තිසකුට්ටි ආරච්චි මහතා,— ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ස්වාධීන රූපවාහිනී සේවය සතුව විශාල වාහන සංඛ්‍යාවක් තිබියදී වර්ෂ 2015 සිට 2019 දක්වා වූ කාලය තුළ දී එම ආයතනය විසින් පෞද්ගලික වාහන කුලියට ගෙන තිබේද;

(ii) එසේ නම්, ඒ සඳහා වැය කර ඇති මුදල කොපමණද;

(iii) එම පෞද්ගලික වාහන කුලියට ගැනීම සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරින්ගේ නම් කවරේද;

(iv) එම නිලධාරින්ට විරුද්ධව ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1987/2021

ගරු චන්දිම වීරක්කොඩි මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජාතික ධීවර හා නාවික ඉංජිනේරු ආයතනයේ (සාගර විශ්වවිද්‍යාලය) ගාල්ල ප්‍රාදේශීය කාර්යාලය සඳහා බූස්ස ප්‍රදේශයේ වෙන් කර ඇති ඉඩමේ සංවර්ධන කටයුතු මේ වනවිට ආරම්භ කර ක්‍රියාත්මක කරමින් තිබේද;

(ii) නොඑසේ නම්, එම සංවර්ධන කටයුතු මේ වනවිට නතර කර තිබේද;

(iii) ඉහත සඳහන් ඉඩමෙන් හෙක්ටයාර් 1.47ක් කිසියම් වෙනත් අරමුණක් සඳහා ආයතනයකට පවරා දීම සඳහා සැලසුම් කර තිබේද;

(iv) එසේ නම්, එම පවරා දීම, ජාතික ධීවර හා නාවික ඉංජිනේරු ආයතනය දියුණු කිරීමට වඩා වැදගත් වන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2021 නොවැම්බර් 27 සෙනසුරාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

864/2020

ගරු අමරකීර්ති අතුකෝරළ මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දිවයින පුරා පිහිටි රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව සතු රාජ්‍ය ඔසුසල් සංඛ්‍යාව කොපමණද;

(ii) රාජ්‍ය ඔසුසල් පිහිටා නොමැති දිස්ත්‍රික්ක තිබේ නම්, එම දිස්ත්‍රික්ක කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) පසුගිය රජය සමයේ ගුණාත්මයෙන් පහළ සහ කල් ඉකුත් වූ ඖෂධ රාජ්‍ය ඔසුසල් සඳහා නිකුත් කළ බව එතුමා දන්නෙහිද?

(ඇ) (i) වර්ෂ 2015 සිට 2019 දක්වා රාජ්‍ය ඔසුසල් සඳහා නිකුත් කර ඇති ගුණාත්මයෙන් පහළ සහ කල් ඉකුත් වූ ඖෂධ ප්‍රමාණය;

(ii) එම ඖෂධවල වටිනාකම;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) (i) රාජ්‍ය ඔසුසල් සඳහා කල් ඉකුත් වූ ඖෂධ නිකුත් කිරීමට හේතු;

(ii) එම ඖෂධවල වටිනාකම අදාළ සැපයුම්කරුවන්ගෙන් අයකර ගැනීමට ගනු ලැබූ පියවර;

(iii) වටිනාකම අයකර ගෙන නොමැති සැපයුම්කරුවන්ට එරෙහිව ගනු ලැබූ ක්‍රියාමාර්ග;

කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

975/2020

ගරු වේලු කුමාර් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කඳුරට වැවිලි කටයුතු සිදු කරනු ලබන ප්‍රදේශවල සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා "වැවිලි කලාපය සඳහා වූ නව ගම්මාන අධිකාරිය" ස්ථාපිත කර තිබූ බවත්;

(ii) එම ආයතනය වතු නිවාස හා ප්‍රජා යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශය යටතට පත් කර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම ආයතනයේ පරිපාලන ව්‍යුහය;

(ii) එම ආයතනයේ අරමුණු හා ක්‍රියාකාරකම් වෙන් වෙන් වශයෙන්;

(iii) එම ආයතනය සඳහා මේ වනවිට පත්වීම් ලබා දී ලබා ඇති පුද්ගලයන්ගේ නම්;

(iv) එම එක් එක් පුද්ගලයාට පත්වීම ලබා දීමේදී සලකා බලන ලද සුදුසුකම් වෙන් වෙන් වශයෙන්;

කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) එම ආයතනයේ අනාගත ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් සැලසුම් සකස් කර තිබේ ද;

(ii) එසේ නම්, එම සැලසුම් පිළිබඳව විස්තර කරන්නේද;

(iii) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1209/2020

ගරු වරුණ ලියනගේ මහතා,— වැවිලි අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ මේ වනවිට තේ පරීක්ෂකවරුන්ගේ දැඩි හිඟයක් පවතින බවත්;

(ii) රත්නපුර දිස්ත්‍රික්කයේ පිහිටා ඇති තේ පරීක්ෂක කොට්ඨාස 25න් 08ක තේ පරීක්ෂකවරුන් නොමැති බවත්;

(iii) මේ හේතුවෙන් එක් තේ පරීක්ෂකවරයෙකුට කොට්ඨාස කිහිපයක වැඩ ආවරණය කිරීමට සිදු වීම හේතුවෙන් නිසි සේවයක් සිදු නොවන බවත්;

(iv) තේ නැවත වගාව සඳහා හෙක්ටයාර් එකකට ලබා දෙනු ලබන රුපියල් ලක්ෂ පහක් වූ සහනාධාර මුදල ප්‍රමාණවත් නොවන බවත්;

(v) පාළු සිටුවීමේදී එක් තේ පැළයකට ලබා දෙන ලද රුපියල් 25ක් වූ සහනාධාර මුදල, පසුගිය රජය විසින් රුපියල් 100ක් දක්වා වැඩි කළ බවත්;

(vi) එසේ වැඩි කරන ලද මුදල් සහ තේ නැවත වගාව සඳහා ලබා දෙනු ලබන සහනාධාර මුදල් තේ වගාකරුවන්ට ලබා දීමේදී දැඩි ප්‍රමාදයක් පවතින බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) ඉහත (iv) හි සඳහන් සහනාධාර මුදල වැඩි කිරීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1291/2020

ගරු කිංස් නෙල්සන් මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ඇති ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩල ඩිපෝ සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ නම් කවරේද;

(iii) ඉහත සඳහන් එක් එක් ඩිපෝවේ ධාවනයට සුදුසු තත්ත්වයේ පවතින බස් රථ සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ඉහත සඳහන් එක් එක් ඩිපෝවේ පවතින සේවක පුරප්පාඩු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) පොළොන්නරුව දිස්ත්‍රික්කයේ දුෂ්කර ගම්මානවලට ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ බස් රථ මඟින් ප්‍රවාහන පහසුකම් ලබා දීමට අමාත්‍යාංශය විසින් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2197/2021

ගරු යූ.කේ. සුමිත් උඩුකුඹුර මහතා,—ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට 2019 දක්වා ඉඩම් විෂයභාර අමාත්‍යවරයා ලෙස කටයුතු කරන ලද එක් එක් අමාත්‍යවරයාගේ නම හා ධුර කාලය වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) ඉහත එක් එක් අමාත්‍යවරයා විසින් සිය ධුර කාලය තුළ පත් කරන ලද උපදේශකවරුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම එක් එක් උපදේශකවරයාගේ නම, වයස, අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එක් එක් උපදේශකවරයා සඳහා ගෙවන ලද මාසික වැටුප, දීමනා සහ ලබා දී තිබූ වෙනත් පහසුකම් කවරේද;

(v) එම එක් එක් උපදේශකවරයා වෙත පවරා දී තිබූ වගකීම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(vi) එම එක් එක් උපදේශකවරයා නිරත වී ඇති විදේශ සංචාර, එම විදේශ සංචාරවල නිරත වීම සඳහා හේතු වූ කරුණු, ඒ සඳහා දරන ලද වියදම් හා එමඟින් අමාත්‍යාංශයට අත් වූ ප්‍රතිලාභ වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2021 නොවැම්බර් 29 සඳුදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

294/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාවේ පන් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්තකරුවන් මේ වනවිට එම කර්මාන්තයෙන් ඉවත් වෙමින් සිටින බවත්;

(ii) එම කර්මාන්තකරුවන්ට අමුද්‍රව්‍ය සපයා ගැනීමේ සහ නිෂ්පාදන අලෙවි කර ගැනීමේ ගැටලු පවතින බවත්;

(iii) එම කර්මාන්තය මඟින් විශාල විදේශ විනිමය ප්‍රමාණයක් උපයාගත හැකි බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාවේ පන් ආශ්‍රිත නිෂ්පාදන අපනයනය කරන්නේද;

(ii) එසේ නම්, වර්ෂ 2015දී එමඟින් උපයාගන්නා ලද විදේශ ආදායම කොපමණද;

(iii) ශ්‍රී ලංකාවේ පන් ආශ්‍රිත නිෂ්පාදන අපනයනය නොකරන්නේ නම්, ඒවා අපනයනය කිරීමට කටයුතු කරන්නේද;

(iv) එසේ නම්, එම දින වකවානු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ශ්‍රී ලංකාවේ පන් ආශ්‍රිත නිෂ්පාදන සඳහා වෙළඳපොළ පුළුල් කිරීමට පියවර ගෙන තිබේද;

(ii) එසේ නම්, එම පියවර කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

874/2020

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) පාකිස්ථානය, නේපාලය, බංග්ලාදේශය, මාලදිවයින හා මියන්මාරය ඇතුළු 80 කට අධික රටවල් සංඛ්‍යාවක් කොවිඩ්-19 වසංගතයෙහි ආර්ථික බලපෑම හමුවේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF) වෙතින් හදිසි අවස්ථා ආධාර ලබා ගෙන ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) කොවිඩ්-19 වසංගතය හේතුවෙන් ශ්‍රී ලංකා රජය ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වෙතින් ආධාර ඉල්ලා තිබේද;

(ii) එසේ නම්, ඉල්ලා ඇති ආධාරවල ස්වභාවය කෙබඳුද;

(iii) ඉහත සඳහන් ආධාර ඉල්ලූ දිනය කවරේද;

(iv) ඉහත සඳහන් ඉල්ලීම සම්බන්ධයෙන් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ප්‍රතිචාර දක්වා තිබේද;

(v) එසේ නම්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ප්‍රතිචාරය කවරේද;

(vi) මේ දක්වා සහන ලැබී ඇති රටවල් 80 ට මෙන් ශ්‍රී ලංකා රජයට සහන නොලැබීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

981/2020

ගරු චාල්ස් නිර්මලනාදන් මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 05කින් සමන්විත මන්නාරම දිස්ත්‍රික්කයේ ගව පාලන කටයුතුවල නිරතවන ගොවීන් සංඛ්‍යාව එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) මන්නාරම දිස්ත්‍රික්කය තුළ ගව පාලනය සඳහා ප්‍රමාණවත් පරිදි තෘණ භූමි නොමැති වීම හේතුවෙන් ආහාර හිඟතාවයෙන් එම සතුන් මරණයට පත්වන බව එතුමා දන්නෙහිද?

(ඇ) (i) මන්නාරම දිස්ත්‍රික්කයේ ගොවිතැන් කටයුතු සිදු කරන කාල වකවානුව තුළ ගවයන් සඳහා තෘණ භූමි අහිමිවන බැවින් එම කාලයේදී ගව පාලනයේ නිරතවන ගොවීන්ට සිය ගවයන් රැගෙන යා හැකි වෙනත් ප්‍රදේශ කවරේද;

(ii) මන්නාරම දිස්ත්‍රික්කයට අයත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තුළ තෘණ භූමි සඳහා ඉඩම් වෙන් කිරීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, එය ක්‍රියාත්මක කරනු ලබන කාල වකවානු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1281/2020

ගරු කුමාරසිරි රත්නායක මහතා,— ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) මොණරාගල, සෙවනගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ස්ථිර හෝ තාවකාලික නිවාසවල පදිංචිව සිටින පවුල් සංඛ්‍යාව;

(ii) එම පදිංචිකරුවන්ගෙන් ඔප්පු හෝ බලපත්‍ර ලබාදී ඇති සංඛ්‍යාව;

(iii) ඉහත (ii) හි ඉඩම් අතරින් ඉඩම් අමාත්‍යාංශය සතු ඉඩම් ප්‍රමාණය;

කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඔප්පු හෝ බලපත්‍ර ලබා දී නොමැති ඉඩම්වල, ස්ථිර හෝ තාවකාලික නිවාස ඉදිකර ඒවායේ පදිංචි වී සිටින පවුල් ඇති බව දන්නේද;

(ii) එසේ නම්, එම පවුල් පදිංචි වී සිටින ඉඩම් අතරින් ඉඩම් අමාත්‍යාංශය සතු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iii) බලපත්‍ර නොමැති ඉඩම් සඳහා බලපත්‍ර ලබාදීමට වැඩපිළිවෙළක් සකස් කර තිබේද;

(iv) එසේ නම්, එම බලපත්‍ර ලබා දෙන දිනය කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1928/2021

ගරු එච්. නන්දසේන මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට 2019 දක්වා ජාතික කලා මණ්ඩලයේ යම් අක්‍රමිකතාවයක්, අයථා පත්වීමක්, දූෂණ ක්‍රියාවක් හෝ නීති විරෝධී ක්‍රියාවක් සිදු වී තිබේද;

(ii) එසේ නම්, ඒවා වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත සඳහන් එක් එක් කරුණ හේතුවෙන් රජයට අහිමි වී ඇති මූල්‍ය, දේපළ හා මානව සම්පත්වල වටිනාකම වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත (අ) (i) හි සඳහන් ක්‍රියාවන්ට වගකිව යුතු නිලධාරීන් හඳුනාගැනීමට විමර්ශන සිදු කර තිබේද;

(ii) වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන ඇත්නම්, ඔවුන්ට එරෙහිව ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iii) ඔවුන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගෙන නොමැති නම්, ඊට හේතු කවරේද;

(iv) ඉදිරියේදී ඔවුන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගනු ලබන්නේද;

(v) ඉදිරියේදී සිදු විය හැකි මෙවැනි දූෂණ ක්‍රියාවන් වැළැක්වීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

**2021 නොවැම්බර් 30 අඟහරුවාදා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

819/2020

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වයඹ පළාත සඳහා වාරි ජලය ලබා දීමේ අරමුණින් වයඹ වාරි ව්‍යාපෘතිය ආරම්භ කර ඇති බව දන්නේද;

(ii) එම ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තුගත මුදල කොපමණද;

(iii) එම මුදල සපයා ගනු ලබන මූලාශ්‍රය කවරේද;

(iv) එම ව්‍යාපෘතිය මඟින් පොල්පිතිගම, සියඹලන්ගමුව වැවට ජලය ලබා ගැනීමට හැකි වන පරිදි සැලසුම් සකස් කර තිබේද;

(v) එසේ නම්, ඒ සඳහා අවශ්‍ය අතිරේක ප්‍රතිපාදන වෙන් කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1428/2021

ගරු වඩිවේල් සුරේෂ් මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වතු ආශ්‍රිතව ජීවත්වන ප්‍රජාවගේ ආගමික, සංස්කෘතික, සුභසාධන හා වෙනත් කටයුතු සඳහා භාවිතා කරනු පිණිස එවකට ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය විසින් බදුල්ල දිස්ත්‍රික්කයේ වතු ආශ්‍රිත ප්‍රදේශ ආවරණය වන පරිදි සංස්කෘතික මධ්‍යස්ථාන 16ක් ඉදිකිරීම සඳහා 2019 වර්ෂයේදී අනුමතිය ලබාදී ඒ සඳහා රුපියල් මිලියන 100ක් වෙන් කරන ලද බවත්;

(ii) ඒ අතරින් සංස්කෘතික මධ්‍යස්ථාන 14ක් ඉදිකිරීම සඳහා ඇස්තමේන්තු සකස් කරන ලද බවත්;

(iii) එහෙත් මේ වනවිට එම සංස්කෘතික මධ්‍යස්ථාන ඉදිකිරීමේ වැඩසටහන නතර වී තිබෙන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) උක්ත සංස්කෘතික මධ්‍යස්ථාන ඉදිකිරීමේ මූලික කටයුතු සඳහා රුපියල් මිලියන 20.5ක් බදුල්ල දිස්ත්‍රික් ලේකම් වෙත ලබා දී තිබේද;

(ii) එම සංස්කෘතික මධ්‍යස්ථාන 16 ඉදිකිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ලබා දෙන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1594/2021

ගරු ඉම්තියාස් බාකීර් මාකාර් මහතා,—ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) කිසිදු ලියවිල්ලකින් තොරව රාජ්‍ය ඉඩම් අත්පත් කරගෙන සංවර්ධනය කර ඇති අය වෙත නෛතික ලියවිලි නිකුත් කිරීම කඩිනම් කරනු පිණිස 2020.09.10 දින නිකුත් කරන ලද අංක 2192/36 දරන අතිවිශේෂ ගැසට් නිවේදනය ඉන් දින 12 කට පසුව අංක 2194/28 දරන 2020.09.22 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් අහෝසි කරනු ලැබූ බව එතුමා දන්නෙහිද?

(ආ) (i) 2020.09.10 දින අංක 2192/36 අතිවිශේෂ ගැසට්පත්‍රය යටතේ එක් එක් දිස්ත්‍රික්කය අනුව ලැබුණු ඉල්ලුම්පත්‍ර සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම ඉල්ලුම්පත්‍ර අතරින් සලකා බලනු ලැබූ ඉල්ලුම්පත්‍ර සංඛ්‍යාව කොපමණද;

(iii) 2020.09.10 සිට 2020.09.22 දින දක්වා නිකුත් කරන ලද ඔප්පු, බලපත්‍ර හා වෙනත් නෛතික ලියවිලි සංඛ්‍යාව කොපමණද;

(iv) එක් එක් ප්‍රතිලාභියාගේ නම, ලිපිනය හා ප්‍රතිලාභියා වෙත වෙන් කර දෙන ලද ඉඩම් කොටසේ විශාලත්වය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

1689/2021

ගරු කුමාර වෙල්ගම මහතා,— ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කළුතර දිස්ත්‍රික්කයේ එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, හිමිකම් ඔප්පු නොමැති ඉඩම්වල පදිංචි වී සිටින පවුල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම පවුල් සඳහා හිමිකම් ඔප්පු ලබාදීමේ ක්‍රමවේදයක් සකස් කර තිබේ නම්, එම ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) කළුතර දිස්ත්‍රික්කයේ පිහිටා ඇති ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් එහෙත් මේ වනතෙක් භාවිතයට ගෙන නොමැති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) එම ඉඩම් ප්‍රමාණය රජයේ පොදු කටයුත්තකට හෝ ඉඩම් නොමැති ජනතාවට ලබාදීමට හෝ බදු දීමට වැඩපිළිවෙලක් සකස් කර තිබේද;

(iii) එසේ නම්, එම වැඩපිළිවෙල කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2975/2021

ගරු අශෝක ප්‍රියන්ත මහතා,— රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වයඹ පළාත් සභාව යටතේ ඇති සියලුම ආයතනවල මේ වනවිට කොන්ත්‍රාත් හා අනියම් පදනම මත සේවය කරනු ලබන සේවකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම සේවකයන් ස්ථිර කිරීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

**2021 දෙසැම්බර් 01 බදාදා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

316/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) කොළඹ වරායේ සිට කොලොන්නාව නිමාව දක්වා ඛනිජ තෙල් ගෙන යනු ලබන නල පද්ධතිය ඉතා පැරණි බවත්;

(ii) ඒ හේතුවෙන් විශාල ලෙස වංචා සිදුවන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) එම නල පද්ධතිය නවීකරණය කිරීම සඳහා අමාත්‍යාංශය විසින් ගනු ලබන පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

867/2020

ගරු ඉම්රාන් මහරූෆ් මහතා,— අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 1970 වන තෙක් ක්‍රියාත්මකව පැවති ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ පිහිටි කින්නියා සංචාරක අධිකරණය, උතුරු නැගෙනහිර පළාත්වල පැවති යුදමය වාතාවරණය හේතුවෙන් තාවකාලිකව වසා දැමූ බවත්;

(ii) ස්ථිර ගොඩනැගිලි ඉදිකරන තෙක් එම අධිකරණ කටයුතු රජයේ ගොඩනැගිල්ලක තාවකාලිකව නැවත ආරම්භ කිරීමට පසුගිය වර්ෂයේදී පියවර ගනු ලැබුවද මේ වන තෙක් එම අධිකරණයේ කටයුතු ආරම්භ කර නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ත්‍රිකුණාමලය අධිකරණයේ ගොනු වන නඩු සංඛ්‍යාව අවම කිරීම සඳහා සහ කින්නියා ප්‍රදේශයේ ජනතාව නඩු කටයුතු වෙනුවෙන් ත්‍රිකුණාමලය වෙත යාමේදී ඇති වන දුෂ්කරතාවයන් අවම කිරීම සඳහා කින්නියා සංචාරක අධිකරණය නැවත ආරම්භ කිරීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1293/2020

ගරු කිංස් නෙල්සන් මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ඇති රජයේ වී ගබඩා සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා පිහිටා ඇති ස්ථාන කවරේද;

(iii) වර්ෂ 2015 සිට මේ දක්වා එම එක් එක් වී ගබඩාවේ ගබඩා කරන ලද වී ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) සහල් මිල ඉහළ ගිය අවස්ථාවලදී ඉහත සඳහන් ගබඩාවල ගබඩා කරන ලද වී තොග, සහල් බවට පත් කර වෙළඳපොළට නිකුත් කිරීමට පියවර ගෙන තිබේද?

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1623/2021

ගරු උද්දික ප්‍රේමරත්න මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) අනුරාධපුර, මහවිලච්චිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ඇලපත්ගම ග්‍රාමය කේන්ද්‍රකර ගනිමින් "පූජ්‍ය මාදුළුවාවේ සෝභිත හිමි ගම" නමින් සංවර්ධන වැඩසටහනක් ක්‍රියාත්මක වූ බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම වැඩසටහන සඳහා මුදල් වෙන් කරන ලද ප්‍රභවය කවරේද;

(ii) එම වැඩසටහන සඳහා වෙන් කරන ලද මුදල් වියදම් කරන ලද්දේ කවුරුන් විසින්ද;

(iii) එම මුදල් වියදම් කරන ලද ආකාරය කවරේද;

(iv) මේ වනවිට එම වැඩසටහනේ භෞතික හා මූල්‍යමය ප්‍රගතිය පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

(v) මේ වනවිට අතරමග නවතා දමා ඇති ඉහත වැඩසටහනේ වැඩ කටයුතු නැවත ආරම්භ කරන්නේද;

(vi) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2273/2021

ගරු ඩී. වීරසිංහ මහතා,—ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට 2019 දක්වා ජනමාධ්‍ය විෂයභාර අමාත්‍යවරයා ලෙස කටයුතු කරන ලද එක් එක් අමාත්‍යවරයාගේ නම හා ධූර කාලය වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) ඉහත එක් එක් අමාත්‍යවරයා විසින් සිය ධූර කාලය තුළ පත් කරන ලද උපදේශකවරුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම එක් එක් උපදේශකවරයාගේ නම, වයස, අධ්‍යාපන සුදුසුකම්, වෘත්තීය සුදුසුකම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම එක් එක් උපදේශකවරයා සඳහා ගෙවන ලද මාසික වැටුප, දීමනා සහ ලබා දී තිබූ වෙනත් පහසුකම් කවරේද;

(v) එම එක් එක් උපදේශකවරයා වෙත පවරා දී තිබූ වගකීම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(vi) එම එක් එක් උපදේශකවරයා නිරත වී ඇති විදේශ සංචාර, එම විදේශ සංචාරවල නිරත වීම සඳහා හේතු වූ කරුණු, එම සංචාර සඳහා දරන ලද වියදම් හා එමඟින් අමාත්‍යාංශයට අත්වූ ප්‍රතිලාභ වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

**2021 දෙසැම්බර් 02 බ්‍රහස්පතින්දා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

460/2020

ගරු මොහමඩ් මුසම්මිල් මහතා,— මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට 2019 දක්වා වූ කාල පරිච්ඡේදය තුළදී මාර්ග සංවර්ධන අධිකාරිය සඳහා මහජන සම්බන්ධතා නිලධාරින් සහ උපදේශකයන් බඳවාගෙන තිබුණේද;

(ii) එසේ නම්, එසේ බඳවාගනු ලැබූ මහජන සම්බන්ධතා නිලධාරින් සහ උපදේශකයින් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම බඳවාගැනීම් සඳහා අනුමතියක් ලැබී තිබුණේද;

(iv) වෙනත් පාර්ශ්වයක් විසින් නිකුත් කරන ලද ලේඛනයක් අනුව ඉහත නිලධාරින් බඳවාගනු ලැබුවේද;

(v)` එසේ නම්, එම ලේඛනය නිකුත් කරන ලද පාර්ශ්වයේ නම කවරේද;

(vi) ඉහත නිලධාරින්ට ගෙවන ලද වැටුප් සහ ප්‍රවාහන දීමනාවල එකතුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

714/2020

ගරු මයන්ත දිසානායක මහතා,— ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් මහනුවර දිස්ත්‍රික්කය තුළ පිහිටා ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) එම ඉඩම් පිහිටි ප්‍රදේශ කවරේද;

(iii) එම ඉඩම් වල පදිංචි වී සිටින පවුල් ඒකක සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් පවුල් ඒකක සඳහා නීත්‍යානුකූල ඔප්පු ලබා දී තිබේද;

(ii) එසේ නම් ලබා දී ඇති ඔප්පු සංඛ්‍යාව කොපමණද;

(iii) ඔප්පු ලබා දිය යුතු එහෙත් මේ වනතෙක් ඔප්පු ලබා දී නොමැති පවුල් ඒකක සංඛ්‍යාව කොපමණද;

(iv) ඉඩම් ඔප්පු නොමැති පවුල් ඒකක සඳහා ඔප්පු ලබා දීමට සකස් කර ඇති වැඩපිළිවෙළ කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

745/2020

ගරු ඉෂාක් රහුමාන් මහතා,— මහජන ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) අනුරාධපුර දිස්ත්‍රික්කයේ පිහිටා ඇති ගල්නෑව පොලිස් ස්ථානය ආරම්භ කරන ලද දිනය කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම පොලිස් ස්ථානය සහ ඊට අයත් නිල නිවාස අබලන් තත්ත්වයක පවතින බවත්;

(ii) ආරම්භ කරන ලද දින සිට මේ වනතෙක් එම ගොඩනැගිලි ප්‍රමාණවත් පරිදි අලුත්වැඩියා කර නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) එම පොලිස් ස්ථානය සහ ඊට අයත් නිල නිවාස අලුත්වැඩියා කරනු ලබන දිනය කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

992/2020

ගරු රෝහණ බංඩාර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජනතාවට බෙදා දීමට නියමිත භාණ්ඩ තොග ජනතාවට බෙදා නොදී අනුරාධපුර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල රඳවා තබා තිබෙන බව එතුමා දන්නේද;

(ii) එසේ නම්, ඒ සම්බන්ධයෙන් අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1938/2021

ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට 2019 දක්වා මහා භාණ්ඩාගාරයේ යම් අක්‍රමිකතාවයක්, අයථා පත්වීමක්, දූෂණ ක්‍රියාවක් හෝ නීති විරෝධී ක්‍රියාවක් සිදු වී තිබේද;

(ii) එසේ නම්, ඒවා වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත සඳහන් එක් එක් කරුණ හේතුවෙන් රජයට අහිමි වී ඇති මූල්‍ය, දේපළ හා මානව සම්පත්වල වටිනාකම වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත (අ) (i) හි සඳහන් ක්‍රියාවන්ට වගකිව යුතු නිලධාරින් හඳුනාගැනීමට විමර්ශන සිදු කර තිබේද;

(ii) වගකිව යුතු නිලධාරින් හඳුනාගෙන ඇත්නම්, ඔවුන්ට එරෙහිව ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iii) ඔවුන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගෙන නොමැති නම්, ඊට හේතු කවරේද;

(iv) ඉදිරියේදී ඔවුන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගනු ලබන්නේද;

(v) ඉදිරියේදී සිදු විය හැකි මෙවැනි ක්‍රියාවන් වැළැක්වීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

**2021 දෙසැම්බර් 03 සිකුරාදා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

77/2020

ගරු හේෂා විතානගේ මහතා,— වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සමූපකාර තොග වෙළඳ සංස්ථාව විසින් ආරම්භ කරන ලද "ගමට සවිය - සතොස බඩිය" ජංගම අළෙවි වැඩසටහන මේ වනවිට ක්‍රියාත්මක වන්නේද;

(ii) එම වැඩසටහන ආරම්භ කිරීමට පෙර නිසි ශක්‍යතා අධ්‍යයනයක් සිදු කර තිබේද;

(iii) නොඑසේ නම්, එම වැඩසටහන ආරම්භ කිරීමේ අවශ්‍යතාවය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම වැඩසටහන සඳහා යොදවන ලද වාහන සංඛ්‍යාව කොපමණද;

(ii) එය ක්‍රියාත්මක කරන ලද කාල වකවානුව කවරේද;

(iii) එම වැඩසටහන සඳහා දරන ලද මුළු වියදම කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

616/2020

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2015 කාලය තුල ජනවාරි මාසයේ සිට 2019 නොවැම්බර් දක්වා ආරක්ෂක මණ්ඩල රැස්වීම පවත්වා ඇති දින සංඛ්‍යාව කවරේද;

(ii) එම රැස්වීම් සඳහා සහභාගිවූවන්ගේ නම් කවරේද;

(iii) ආරක්ෂක මණ්ඩල රැස්වීම සඳහා නීත්‍යානුකූලව සහභාගිවීමට හිමිකම ඇති දේශපාලනඥයන් සහ නිලධාරීන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පැවති සම්ප්‍රදාය බිඳ හෙළමින් ඉහත කාලසීමාව තුළදී, විවිධ පුද්ගලයන් ආරක්ෂක මණ්ඩල රැස්වීම්වලට සහභාගි වී ඇති බව එතුමා දන්නේද;

(ii) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

976/2020

ගරු වේලු කුමාර් මහතා,— වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වික්ටෝරියා ජල විදුලි යෝජනා ක්‍රමය සඳහා වික්ටෝරියා ජලාශය ඉදිකරන ලද අවස්ථාවේදී එවකට තෙල්දෙණිය නගරය එයට යට වූ බවත් ;

(ii) එයට විකල්පයක් ලෙස දිගන - රජවැල්ල උතුර අංක 696 ග්‍රාම නිලධාරි වසමේ දිගන රජවැල්ල නව නගරය ස්ථාපිත කරන ලද බවත්;

(iii) එම නගරය පසු කාලීනව විවිධ පුළුල් කිරීම් හා වෙනස්කම්වලට භාජනය වී ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) එම නගරය ස්ථාපිත කරන ලද මුල් අවස්ථාවේදී, එහි ඉදිකරන ලද ව්‍යාපාරික ස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) මේ වනවිට එම නගරයේ පවතින ව්‍යාපරික ස්ථාන සංඛ්‍යාව කොපමණද;

(iii) ඒ අතරින් බලපත්‍ර ලබා දී ඇති ව්‍යාපාරික ස්ථාන සංඛ්‍යාව කොපමණද;

(iv) බලපත්‍ර නොමැති ව්‍යාපාරික ස්ථාන සංඛ්‍යාව කොපමණද;

(v) බලපත්‍ර නොමැති ව්‍යාපාරික ස්ථාන සඳහා බලපත්‍ර ලබාදීමට පියවර ගන්නේද;

(vi) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1405/2021

ගරු සමන්ප්‍රිය හේරත් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 2015 සිට 2019 දක්වා —

(i) රජය විසින් ඉදිකරන ලද නිවාස සංඛ්‍යාව;

(ii) රජය විසින් ඉදිකරන ලද එක් එක් නිවස ඉදිකිරීම සඳහා වැය කරන ලද මුදල වෙන් වෙන් වශයෙන්;

(iii) ඉදිකරන ලද නිවාස ව්‍යාපෘති (උදාගම්) සංඛ්‍යාව;

(iv) ඉදිකරන ලද එක් එක් උදාගම විවෘත කිරීමේ උත්සවය සඳහා වැය කරන ලද මුදල වෙන් වෙන් වශයෙන්;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) වර්ෂ 2015 සිට 2019 දක්වා —

(i) ඉදිකර ජනතා අයිතියට පත් කරන ලද නිවාස ව්‍යාපෘතිවල සමරු ඵලක වෙනුවෙන් වැය කරන ලද මුදල කොපමණද;

(ii) ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් බෙදා දෙන ලද සිමෙන්ති කොට්ට සංඛ්‍යාව කොපමණද;

(iii) ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් බෙදා දුන් සිමෙන්ති කොට්ට බෙදා දෙන ලද පදනම කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2598/2021

ගරු එම්. ඩබ්ලිව්. ඩී. සහන් ප්‍රදීප් විතාන මහතා,—වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට 2019 දක්වා සංවර්ධන උපාය මාර්ග සහ ජාත්‍යන්තර වෙළඳ විෂයභාර අමාත්‍යවරයා ලෙස කටයුතු කරන ලද එක් එක් අමාත්‍යවරයාගේ නම හා ධුර කාලය වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) ඉහත එක් එක් අමාත්‍යවරයා විසින් සිය ධුර කාලය තුළ පත් කරන ලද උපදේශකවරුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම එක් එක් උපදේශකවරයාගේ නම, වයස, අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තීය සුදුසුකම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම එක් එක් උපදේශකවරයා සඳහා ගෙවන ලද මාසික වැටුප, දීමනා සහ ලබා දී තිබූ වෙනත් පහසුකම් කවරේද;

(v) එම එක් එක් උපදේශකවරයා වෙත පවරා දී තිබූ වගකීම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(vi) එම එක් එක් උපදේශකවරයා නිරත වූ විදේශ සංචාර, එම විදේශ සංචාරවල නිරත වීම සඳහා හේතු වූ කරුණු, එම සංචාර සඳහා දරන ලද වියදම් හා එමඟින් අමාත්‍යාංශයට අත්වූ ප්‍රතිලාභ වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2021 දෙසැම්බර් 04 සෙනසුරාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

972/2020

ගරු එස්.එම්.එම්. මුෂාරෆ් මහතා,— වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අම්පාර දිස්ත්‍රික්කයේ, පොතුවිල් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පී/17 ග්‍රාම නිලධාරි වසමේ කෘෂිකාර්මික කටයුතුවල නිරතවන ජනතාවගේ වගාවන් වන අලි විසින් නිරන්තරයෙන් විනාශ කරනු ලබන බවත්;

(ii) වන අලි තර්ජනය හේතුවෙන් ඉහත ප්‍රදේශවල ජීවත්වන පාසල් ළමුන් පාසල් යාමට අකමැත්තක් දක්වන බවත්;

(iii) ප්‍රදේශයේ අලි වැටවල් වන අලින් විසින් විනාශ කර ඇති බවත්;

(iv) අලි වැට සකස් කර දෙන ලෙස අදාළ නිලධාරීන්ගෙන් ඉල්ලීම් කළද එය මේ වනතෙක් ඉටු කර නොමැති බවත්;

(v) මේ හේතුවෙන් එම ජනතාවට ප්‍රදේශය අත්හැර වෙනත් ප්‍රදේශවලට සංක්‍රමණය වීමට සිදුවන තත්ත්වයක් උදාවී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) මේ සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1088/2020

ගරු නිරෝෂන් පෙරේරා මහතා,— අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බන්ධනාගාර තුළින් මේ වනවිට වාර්තා වී ඇති මුළු කොවිඩ්-19 රෝගය ආසාදිතයන් සංඛ්‍යාව;

(ii) ඒ අතරින් කොවිඩ්-19 රෝගය ආසාදිත සිරකරුවන් සහ බන්ධනාගාර නිලධාරීන් සංඛ්‍යාව;

(iii) කොවිඩ්-19 රෝගය ආසාදනය වීම හේතුවෙන් බන්ධනාගාර තුළදී මියගිය පුද්ගලයන් සංඛ්‍යාව;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) කොවිඩ්-19 රෝගය, බන්ධනාගාර තුළ පැතිරීම වැළැක්වීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

(ii) ඒ සඳහා වෙන් කර ඇති මුදල කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1103/2020

ගරු ජේ.සී. අලවතුවල මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොවිඩ් - 19 වසංගතය හේතුවෙන්, ලීසිං පදනම මත වාහන ලබා ගත් පුද්ගලයන්ට සිය ලීසිං වාරික ගෙවීම සඳහා 2020 මාර්තු සිට මාස 06ක සහන කාලයක් ලබා දුන් බවත්;

(ii) එම සහන කාලය සඳහා ලීසිං සමාගම් විසින් ලීසිං පදනම මත වාහන ලබා ගත් පුද්ගලයන්ගෙන් අධික පොලියක් අය කළ බවත්;

(iii) කොවිඩ් - 19 වසංගතයේ දෙවන ව්‍යාප්තිය හේතුවෙන්, ලීසිං වාරික ගෙවීම සඳහා 2020 ඔක්තෝබර් සිට නැවත වරක් මාස 06ක සහන කාලයක් ලබා දී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත (අ) (iii) හි සඳහන් සහන කාලය සඳහාද ලීසිං පදනම මත වාහන ලබා ගත් පුද්ගලයන්ගෙන් පළමු වාරයේදී මෙන් පොලියක් අය කිරීම වැළැක්වීමට පියවර ගන්නේද;

(ii) මුල් සහන කාලය සඳහා පොලියක් අය කිරීම හේතුවෙන් සිදු වූ අසාධාරණය නිවැරදි කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1334/2020

ගරු කේ.පී.එස්. කුමාරසිරි මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ පිහිටා ඇති රජයේ ආයුර්වේද රෝහල්;

(ii) එම රෝහල් සඳහා අනුමත ආයුර්වේද වෛද්‍යවරුන්, මේ වනවිට සේවය කරනු ලබන වෛද්‍යවරුන් සහ පවතින වෛද්‍ය පුරප්පාඩු;

(iii) එම රෝහල්වල අනෙකුත් තනතුරුවල පවතින පුරප්පාඩු;

සංඛ්‍යාව කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) දිස්ත්‍රික්කයේ සිටින ලියාපදිංචි පාරම්පරික ආයුර්වේද වෛද්‍යවරු සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ගේ දැනුම සහ කුසලතා වර්ධනය සඳහා සකස් කර ඇති වැඩපිළිවෙළ කවරේද;

(iii) නව පාරම්පරික ආයුර්වේද වෛද්‍යවරු ලියාපදිංචිය සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iv) පාරම්පරික ආයුර්වේද වෛද්‍ය විද්‍යාව ඉගැන්වීම සඳහා වෛද්‍ය විද්‍යාල ස්ථාපනය කිරීම සඳහා සැලසුම් කර තිබේද;

(v) එසේ නම්, එම සැලසුම් කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ පවතින ආයුර්වේද ඔසු උයන් සංඛ්‍යාව කොපමණද;

(ii) දිස්ත්‍රික්කයේ ස්ථාපනය කිරීමට යෝජිත නව ආයුර්වේද ඖෂධ උයන් සංඛ්‍යාව කොපමණද;

(iii) දේශීය ඖෂධ වර්ග නිෂ්පාදනය සහ පර්යේෂණ සඳහා වැඩපිළිවෙළක් සකස්කර තිබේද;

(iv) එසේ නම්, එම වැඩපිළිවෙළ කවරේද;

යන්න වැඩිදුරටත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1989/2021

ගරු ගරු බී. වයි. ජී. රත්නසේකර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට 2019 දක්වා ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ යම් අක්‍රමිකතාවයක්, අයථා පත්වීමක්, දූෂණ ක්‍රියාවක් හෝ නීති විරෝධී ක්‍රියාවක් සිදු වී තිබේද;

(ii) එසේ නම්, ඒවා වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත සඳහන් එක් එක් කරුණ හේතුවෙන් රජයට අහිමි වී ඇති මූල්‍ය, දේපළ හා මානව සම්පත්වල වටිනාකම වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත (අ) (i) හි සඳහන් ක්‍රියාවන්ට වගකිව යුතු නිලධාරීන් හඳුනාගැනීමට විමර්ශන සිදු කර තිබේද;

(ii) වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන ඇත්නම්, ඔවුන්ට එරෙහිව ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iii) ඔවුන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගෙන නොමැති නම්, ඊට හේතු කවරේද;

(iv) ඉදිරියේදී ඔවුන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගනු ලබන්නේද;

(v) ඉදිරියේදී සිදු විය හැකි මෙවැනි ක්‍රියාවන් වැළැක්වීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2021 දෙසැම්බර් 06 සඳුදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

444/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— කම්කරු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සිය නමින් ආයතනයක් තිබෙන බව දන්නේද;

(ii) එම ආයතනයේ දැක්ම, මෙහෙවර සහ කාර්යභාරය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) විදේශ රැකියා අවස්ථා බෙදා හැරීමේදී එම ආයතනය විසින් වංචා සහ දූෂණ සිදු කරනු ලබන බව දන්නේද;

(iv) එම වංචා සහ දූෂණ වළක්වා ගැනීමට අමාත්‍යාංශය විසින් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1422/2021

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) පසුගිය රජය විසින් 2017 ඔක්තෝබර් මාසයේදී සියලුම පාසල් සිසුන් සඳහා හඳුන්වා දෙන ලද 'සුරක්ෂා ශිෂ්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය' වර්තමාන රජය විසින් 2020 වර්ෂයේදී නැවතත් ක්‍රියාත්මක කරන ලද බව එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම රක්ෂණ යෝජනා ක්‍රමය නැවත ක්‍රියාත්මක කිරීම ආරම්භ වන දිනය කවරේද;

(ii) මෙම රක්ෂණ යෝජනා ක්‍රමය යම් කාල පරිච්ඡේදයක් පුරා ක්‍රියාත්මක නොවී පැවතියේද;

(iii) මෙම රක්ෂණ යෝජනා ක්‍රමය ආරම්භයේ සිට පිරිනමන ලද එක් එක් කොන්ත්‍රාත්තුවෙහි කොන්ත්‍රාත් සමාගම සහ කොන්ත්‍රාත්තුව වලංගු වන දිනය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එක් එක් කොන්ත්‍රාත්තුව ලබා දුන් ආකාරය වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) පිරිනමන ලද එක් එක් කොන්ත්‍රාත්තුවෙහි වටිනාකම වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) 2020 වර්ෂයේදී පිරිනමන ලද 'සුරක්ෂා ශිෂ්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය' මගින් ආවරණය වන සිද්ධීන්ට අදාළව යම් ප්‍රධාන වෙනස්කම් කිසිවක් සිදු වී තිබේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නො එසේ නම්, ඒ මන්ද?

1440/2021

ගරු අමරකීර්ති අතුකෝරළ මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ලංකා ගමනාගමන මණ්ඩලය යටතේ ඇති එක් එක් ඩිපෝවේ —

(i) සේවක සංඛ්‍යාව;

(ii) ධාවනය කරනු ලබන දුර ගමන් බස් රථ හා කෙටි ගමන් බස් රථ සංඛ්‍යාව;

(iii) වර්ෂ 2015 සිට 2020 දක්වා ආදායම එක් එක් වර්ෂය අනුව ;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ලංකා ගමනාගමන මණ්ඩලය යටතේ උප ඩිපෝ තිබේද;

(ii) දියසෙන්පුර උප ඩිපෝව ප්‍රධාන ඩිපෝවක් ලෙස උසස් කරන්නේද;

යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1441/2021

ගරු මනුෂ නානායක්කාර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අමාත්‍යාංශ ලේකම්වරුන්;

(ii) රජයේ සංස්ථා සභාපතිවරුන්;

(iii) රජයේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්;

(iv) රජයේ ආයතනවල ක්‍රියාකාරී අධ්‍යක්ෂවරුන්;

(v) රාජ්‍ය ව්‍යාපාර සභාපතිවරුන්;

(vi) රජයේ ආයතනවල ප්‍රධාන විධායක නිලධාරීන්;

ලෙස මේ වනවිට සේවය කරනු ලබන සක්‍රිය සේවයේ හෝ විශ්‍රාමික, හමුදා හෝ පොලිස් නිලධාරීන් සංඛ්‍යාව කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම එක් එක් අමාත්‍යාංශ ලේකම්වරයා / සංස්ථා සභාපතිවරයා / දෙපාර්තමේන්තු ප්‍රධානියා / ක්‍රියාකාරී අධ්‍යක්ෂවරයා / රාජ්‍ය ව්‍යාපාර සභාපතිවරයා /ප්‍රධාන විධායක නිලධාරියාගේ නම, ඔහු සේවය කරනු ලබන එක් එක් අමාත්‍යාංශය / සංස්ථාව / දෙපාර්තමේන්තුව / ආයතනය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1795/2021

ගරු රෝහණ දිසානායක මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ලෝක බැංකු ආධාර යටතේ කෘෂිකර්ම නවීකරණ ව්‍යාපෘතියක් කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරන්නේද;

(ii) එම ව්‍යාපෘතිය සඳහා ලැබී තිබෙන ආධාර මුදල කොපමණද;

(iii) ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක කර තිබෙන වැඩසටහන් කවරේද;

(iv) එම වැඩසටහන් ක්‍රියාත්මක කරන ලද ස්ථානවල නම් කවරේද;

(v) එම වැඩසටහන්වල ප්‍රගතිය කවරේද;

(vi) එම වැඩසටහන් සම්බන්ධයෙන් අනාගත සැලසුම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2021 දෙසැම්බර් 07 අඟහරුවාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

466/2020

ගරු මොහමඩ් මුසම්මිල් මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) වර්ෂ 2015 සිට 2019 දක්වා වූ එක් එක් වර්ෂයේ ශ්‍රී ලංකාවේ උත්පාදනය වූ නව රැකියා සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඉහත එක් එක් වර්ෂයේ ශ්‍රී ලංකාවේ විරැකියා අනුපාතය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) 2014 වර්ෂයට සාපේක්ෂව ඉහත කාලය තුළදී සිදු වූ විරැකියා අනුපාතයේ වෙනස කවරේද;

(iv) වර්ෂ 2015 සිට 2020 දක්වා ශ්‍රී ලංකාවේ දිගුකාලීන නිෂ්පාදන ධාරිතාවයේ සිදු වූ වෙනස කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

794/2020

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතලේ දිස්ත්‍රික්කයේ ගම්මාන අතරින් පානීය ජල ගැටලුව පවතින ගම්මාන සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ නම් කවරේද;

(iii) මාතලේ දිස්ත්‍රික්කයේ පානීය ජල ගැටලුව විසඳීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

841/2020

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා,— කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මඩකළපුව දිස්ත්‍රික්කයේ, මණ්ඩූර් ප්‍රදේශයේ පිහිටා ඇති උළු කර්මාන්තශාලාව දීර්ඝ කාලයක් තිස්සේ ක්‍රියාත්මක තත්ත්වයේ නොපවතින බවත්;

(ii) එම උළු කර්මාන්තශාලාවේ නිෂ්පාදන කටයුතු නැවත ආරම්භ කිරීමෙන් මණ්ඩූර් ප්‍රදේශයේ ජීවත්වන රැකියා විරහිත ජනතාවට රැකියා අවස්ථා උත්පාදනය කළ හැකි බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) එම උළු කර්මාන්තශාලාවේ නිෂ්පාදන කටයුතු නැවත ආරම්භ කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1104/2020

ගරු ජේ.සී. අලවතුවල මහතා,— මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාවතගම - බරන්දන මාර්ගය කාපට් කිරීමේ ව්‍යාපෘතියේ වැඩ ආරම්භ කරන ලද දිනය කවරේද;

(ii) එම ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුදල කොපමණද;

(iii) එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබන ආයතනයේ නම කවරේද;

(iv) එම ව්‍යාපෘතියේ වර්තමාන තත්ත්වය කවරේද;

(v) එම ව්‍යාපෘතිය නිම කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2610/2021

ගරු මර්ජාන් ෆලීල් මහතා,—ප්‍රවාහන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට 2019 දක්වා ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා විෂයභාර අමාත්‍යවරයා ලෙස කටයුතු කරන ලද එක් එක් අමාත්‍යවරයාගේ නම හා ධූර කාලය වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) ඉහත එක් එක් අමාත්‍යවරයා විසින් සිය ධූර කාලය තුළ පත් කරන ලද උපදේශකවරුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම එක් එක් උපදේශකවරයාගේ නම, වයස, අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තීය සුදුසුකම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම එක් එක් උපදේශකවරයා සඳහා ගෙවන ලද මාසික වැටුප, දීමනා සහ ලබා දී තිබූ වෙනත් පහසුකම් කවරේද;

(v) එම එක් එක් උපදේශකවරයා වෙත පවරා දී තිබූ වගකීම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(vi) එම එක් එක් උපදේශකවරයා නිරත වූ විදේශ සංචාර, එම විදේශ සංචාරවල නිරත වීම සඳහා හේතු වූ කරුණු, එම සංචාර සඳහා දරන ලද වියදම් හා එමගින් අමාත්‍යාංශයට අත්වූ ප්‍රතිලාභ වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමිය සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2021 දෙසැම්බර් 08 බදාදා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

514/2020

ගරු හේෂා විතානගේ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලවලට උප කුලපතිවරු පත් කිරීම සම්බන්ධයෙන් නව චක්‍රලේඛයක් නිකුත් කර තිබේද;

(ii) එම චක්‍රලේඛය සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල ආචාර්යවරුන් අතර යම් මතභේදයක් පැන නැගී තිබේද;

(iii) එම චක්‍රලේඛය සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

807/2020

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වැඩ බැලීමේ පදනම මත දිවයිනපුරා පිහිටි පාසල්වල සේවය කරන විදුහල්පතිවරුන් සංඛ්‍යාව;

(ii) ඒ අතරින් උතුරු හා නැගෙනහිර පළාත තුළ සේවයේ යෙදී සිටින විදුහල්පතිවරුන් සංඛ්‍යාව;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වැඩ බැලීමේ පදනම මත පත්වීම් ලබා දී ඇති විදුහල්පතිවරුන්ට වැටුප් වැඩිවීම්, උසස්වීම් සහ ස්ථාන මාරු ලබා නොදීමට හේතු;

(ii) එම විදුහල්පතිවරුන්ට වැටුප් වැඩිවීම්, උසස්වීම් සහ ස්ථාන මාරු ලබා දෙනු ලබන දින වකවානු;

(iii) සාමාන්‍ය ක්‍රමවේදය යටතේ වැඩ බැලීමේ පදනමින් සේවය කරන විදුහල්පතිවරුන් ස්ථිර සේවයට අන්තර්ග්‍රහණය කරනු ලැබුවද වර්තමානයේදී ඔවුන්ව ස්ථිර සේවයට අන්තර්ග්‍රහණය නොකිරීමට හේතු;

(iv) එම විදුහල්පතිවරුන් ස්ථිර සේවයට අන්තර්ග්‍රහණය නොකිරීමට හේතු;

කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේනම්, ඒ මන්ද?

858/2020

ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) පසුගිය ජනාධිපතිවරණය ආසන්නයේදී, දේශපාලන හිතවත්කම් මත සමෘද්ධි ව්‍යාපාරයේ අරමුදල් අවභාවිතා කිරීම හා සමෘද්ධි බැංකු කාර්ය මණ්ඩලය සඳහා දේශපාලන පදනමින් පත්වීම් ලබාදීම නීත්‍යානුකූල නොවන බව මැතිවරණ කොමිෂන් සභාව විසින් එවකට අමාත්‍ය මණ්ඩලය වෙත වාර්තා කර තිබූ බව එතුමා දන්නෙහිද?

(ආ) ඒ සම්බන්ධයෙන් වර්තමාන රජය ගෙන ඇති පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) 2015.01.12 සිට 2015.06.26 කාලය තුළ සමෘද්ධි විෂයභාර අමාත්‍යවරයා ලෙස කටයුතු කළ අමාත්‍යවරයාගේ කාලයේදී රුපියල් ලක්ෂයේ ණය යෝජනා ක්‍රමය යටතේ ලබා දී ඇති ණය මුදල;

(ii) එසේ ලබා දුන් ණයවලින් මේ වනවිට අය වී ඇති මුදල;

(iii) තවදුරටත් අයවීමට ඉතිරිව තිබෙන මුදල;

එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) එවකට පැවති රජය දේශපාලන පදනමින් තෝරා ගත් පිරිසක් සඳහා මෙම ණය ලබා දුන් බව එතුමා පිළිගන්නෙහිද?

(ඉ) එසේ සාවද්‍ය ආකාරයෙන් ණය ලබා දීම පිළිබඳව ගනු ලබන පියවර කවරේද යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඊ) නොඑසේ නම්, ඒ මන්ද?

1420/2021

ගරු අශෝක් අබේසිංහ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහනුවර, තෙල්දෙණිය අධ්‍යාපන කලාපයේ මහ/තෙල්/නාමගල් දෙමළ විද්‍යාලයේ වැඩ බලන විදුහල්පති ලෙස කටයුතු කරන ලද ඩී. සෂිකුමාර් මහතා දුෂ්කර පාසලකට සාමාන්‍ය ගුරුවරයකු ලෙස ස්ථාන මාරු කරන ලද බවත්;

(ii) මේ සම්බන්ධයෙන් සිදු කරන ලද පරීක්ෂණයකින් පසුව ශෂිකුමාර් මහතා නැවත සේවයේ පිහිටුවීමට නිර්දේශ කරන ලදුව තෙල්දෙණිය නවනගල දෙමළ විද්‍යාලයේ වැඩ බලන විදුහල්පති ලෙස නැවත පත් කර ඇති බවත්;

(iii) මේ වනතෙක් ඒ මහතාට රාජකාරි භාරදීම හෝ කාර්යාලය ලබාදීම සිදු කර නොමැති බවත්;

(iv) මේ වනවිට වසරක් පමණ ගත වුවද, ඉහත සඳහන් ගැටලුව විසඳීම සඳහා පියවර ගෙන නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) සෂිකුමාර් මහතාට සිදු වී ඇති අගතිය පිළිබඳව සාධාරණය ඉටුකිරීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2001/2021

ගරු නිමල් පියතිස්ස මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට 2019 දක්වා ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලයේ යම් අක්‍රමිකතාවයක්, අයථා පත්වීමක්, දූෂණ ක්‍රියාවක් හෝ නීති විරෝධි ක්‍රියාවක් සිදු වී තිබේද;

(ii) එසේ නම්, ඒවා වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත සඳහන් එක් එක් කරුණ හේතුවෙන් රජයට අහිමි වී ඇති මූල්‍ය, දේපළ හා මානව සම්පත්වල වටිනාකම වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත (අ) (i) හි සඳහන් ක්‍රියාවන්ට වගකිව යුතු නිලධාරින් හඳුනාගැනීමට විමර්ශන සිදු කර තිබේද;

(ii) වගකිව යුතු නිලධාරින් හඳුනාගෙන ඇත්නම්, ඔවුන්ට එරෙහිව ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iii) ඔවුන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගෙන නොමැති නම්, ඊට හේතු කවරේද;

(iv) ඉදිරියේදී ඔවුන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගනු ලබන්නේද;

(v) ඉදිරියේදී සිදු විය හැකි මෙවැනි ක්‍රියාවන් වැළැක්වීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2021 දෙසැම්බර් 09 බ්‍රහස්පතින්දා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

821/2020

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— කම්කරු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ පුරවැසියන් විදේශ රටවල සේවය කිරීම මඟින් ශ්‍රී ලංකාවට විශාල විදේශ විනිමය ප්‍රමාණයක් ලැබෙන බවත්;

(ii) ගෘහ සේවය සඳහා මේ වනවිට විදේශ ගතව සිටින කාන්තාවන් විවිධ ප්‍රශ්නවලට මුහුණ දෙන බවත්;

(iii) නුපුහුණු කාන්තාවන් විදේශ රැකියා සඳහා යොමු කිරීම වෙනුවට පුහුණු පිරිමි ශ්‍රමිකයන් විදේශ රැකියා සඳහා යොමු කිරීම සුදුසු බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) ගෘහ සේවය සඳහා මේ වනවිට විදේශගතව සිටින කාන්තාවන් සංඛ්‍යාව කොපමණද;

(ii) පුහුණු පිරිමි ශ්‍රමිකයන් විදේශ රැකියා සඳහා යොමු කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iii) ඔවුන් යොමු කිරීමට මේ වනවිට හඳුනාගෙන ඇති විදේශ රැකියා ක්ෂේත්‍ර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1233/2020

ගරු චාල්ස් නිර්මලනාදන් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) උතුරු පළාතේ පිහිටා ඇති පුරාවිද්‍යා ස්ථානවල නම් එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් ගැසට් පත්‍ර මඟින් අත්පත් කර ගෙන ඇති උතුරු පළාතේ ඉඩම් ප්‍රමාණය, එම ඉඩම් පිහිටා ඇති ප්‍රදේශ සහ එම ඉඩම් අත්පත් කර ගන්නා ලද වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) වවුනියාව දිස්ත්‍රික්කයේ වවුනියා-උතුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් නෙඩුන්කේනි ප්‍රදේශයේ වෙඩුක්කුනාරි කන්දේ පිහිටා ඇති ආදිලිංකේෂ්වර් කෝවිලේ හින්දු භක්තිකයන් විසින් පුරාණ කාලයේ සිට ආගමික වතාවත් පවත්වන බවත්;

(ii) එහෙත් ඉහත සඳහන් කෝවිලේ වාර්ෂික උත්සවය පැවැත්වීම පසුගිය අවුරුදු 2ක පමණ කාලයක සිට පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් තහනම් කර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) ඉදිරියේදී ඉහත සඳහන් කෝවිලේ වාර්ෂික උත්සවය පවත්වාගෙන යාමට අවස්ථාව ලබා දෙන්නේද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1648/2021

ගරු මුජිබුර් රහුමාන් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොළඹ දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක වන කුඩා මාතෘ රෝහල් සංඛ්‍යාව එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම මාතෘ රෝහල්වල සායනවලට පැමිණෙන ගැබිණි මාතාවන් සහ දරුවන්ගේ පෝෂණ මට්ටම ඉහළ නැංවීම සඳහා ක්‍රියාත්මක කරනු ලබන ත්‍රිපෝෂ ලබාදීමේ වැඩසටහන සාර්ථකව පවත්වාගෙන යනු ලබන්නේද;

(iii) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

(iv) එම වැඩසටහන ඉදිරියේදී සාර්ථකව පවත්වාගෙන යාම සඳහා ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1860/2021

ගරු අනුර දිසානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා ගෙන් ඇසීමට,— (1)

(අ) (i) අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව සඳහා විමර්ශන නිලධාරීන් 200ක් බඳවාගැනීමට 2018 වර්ෂයේදී අයදුම්පත් කැඳවූ බවත්;

(ii) 2018.10.27 වන දින පවත්වන ලද බඳවාගැනීමේ විභාගයට අයදුම්කරුවන් 10,000ක් පමණ පෙනී සිටි බවත්;

(iii) විභාග ගාස්තු වශයෙන් එක් අයදුම්කරුවකුගෙන් රු.750/- ක් අය කරන ලද බවත්;

(iv) විභාගයෙන් තෝරා ගන්නා ලද අයදුම්කරුවන් 408 දෙනෙකු සම්මුඛ පරීක්ෂණයට කැඳවූ බවත්;

(v) සම්මුඛ පරීක්ෂණයෙන් තෝරා ගන්නා ලද අයදුම්කරුවන් 200 දෙනෙකුගේ ආරක්ෂක නිෂ්කාශන වාර්තා ලබා ගෙන ඇතද මේ දක්වා ඔවුන් බඳවාගෙන නොමැති බවත්;

(vi) ඉහත බඳවාගැනීමේ ක්‍රියාවලිය ආරම්භ කර මේ වනවිට වර්ෂ 2කට අධික කාලයක් සහ එම බඳවාගැනීමට අදාළ වන කටයුතු අවසන් කර වර්ෂ 1 1/2ක පමණ කාලයක් ගත වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් විමර්ශන නිලධාරීන් කඩිනමින් බඳවාගන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2011/2021

ගරු මධුර විතානගේ මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට 2019 දක්වා ජාතික රක්ෂණ භාර අරමුදලේ යම් අක්‍රමිකතාවයක්, අයථා පත්වීමක්, දූෂණ ක්‍රියාවක් හෝ නීති විරෝධී ක්‍රියාවක් සිදු වී තිබේද;

(ii) එසේ නම්, ඒවා වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත සඳහන් එක් එක් කරුණ හේතුවෙන් රජයට අහිමි වී ඇති මූල්‍ය, දේපළ හා මානව සම්පත්වල වටිනාකම වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත (අ) (i) හි සඳහන් ක්‍රියාවන්ට වගකිව යුතු නිලධාරීන් හඳුනාගැනීමට විමර්ශන සිදු කර තිබේද;

(ii) වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන ඇත්නම්, ඔවුන්ට එරෙහිව ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iii) ඔවුන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගෙන නොමැති නම්, ඊට හේතු කවරේද;

(iv) ඉදිරියේදී ඔවුන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගනු ලබන්නේද;

(v) ඉදිරියේදී සිදු විය හැකි මෙවැනි ක්‍රියාවන් වැළැක්වීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2021 දෙසැම්බර් 10 සිකුරාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

325/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) ශ්‍රී ලංකාවට ආවේණික ඒකදේශික උරග සහ සර්ප විශේෂ සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ අතරින් වඳවීයාමේ තර්ජනයට ලක්වීමෙන් රතු දත්ත පොතට ඇතුළත් කර ඇති උරග සහ සර්ප විශේෂ කවරේද;

(iii) මේ වනවිට වඳවී ගොස් ඇති ඒකදේශික උරග සහ සර්ප විශේෂ කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඒකදේශික උරග සහ සර්ප විශේෂ පිළිබඳ මෑතකදී සමීක්ෂණයක් සිදුකර තිබේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

(iii) නොඑසේ නම්, එවැනි සමීක්ෂණයක් සිදු කරන්නේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ඒකදේශික උරග සහ සර්ප විශේෂ ආරක්ෂා කිරීමට ක්‍රියාමාර්ග ගෙන තිබේද;

(ii) එසේ නම්, එම ක්‍රියාමාර්ග කවරේද;

(iii) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

යන්න තවදුරටත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

833/2020

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාව තුළ පවත්වාගෙන යනු ලබන බලපත්‍රලාභී මත්පැන් නිෂ්පාදනාගාර සංඛ්‍යාව කොපමණද;

(ii) එම නිෂ්පාදනාගාරවල නම් කවරේද;

(iii) එම නිෂ්පාදනාගාර පවත්වා ගෙන යනු ලබන ස්ථානවල ලිපිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත (අ) (i) හි සඳහන් මත්පැන් නිෂ්පාදනාගාර අතරින් 2015 වර්ෂයෙන් පසුව වසා දමන ලද මත්පැන් නිෂ්පාදනාගාර තිබේද;

(ii) එසේ නම්, එම නිෂ්පාදනාගාරවල නම් කවරේද;

(iii) එසේ වසා දමන ලද නිෂ්පාදනාගාරවල මත්පැන් නිෂ්පාදන කටයුතු නැවත ආරම්භ කර තිබේද;

(iv) එසේ නම්, ඒ සඳහා හේතු වූ කරුණු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1082/2020

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— විදේශ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කුවේට්හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ සේවයේ නියුතු සේවක සංඛ්‍යාව කොපමණද;

(ii) එම සේවකයන්ගේ නම් හා තනතුරු කවරේද;

(iii) එම සේවකයන් අතරින් මේ වනවිට කොවිඩ්-19 රෝගය වැළඳී ඇති සේවකයන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) කුවේට්හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ සේවකයන්ට කොවිඩ්-19 රෝගය වැළඳීම එරට සේවය කරනු ලබන ශ්‍රී ලාංකිකයන්ට අහිතකර ලෙස බලපාන බව දන්නේද;

(ii) එසේ නම්, මේ සම්බන්ධයෙන් ගනු ලබන පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද;

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2266/2021

ගරු වසන්ත යාපාබණ්ඩාර මහතා,— කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පිළිමතලාව, ගිරාගම ප්‍රදේශයේ පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුවට අයත් විශාල ගොඩනැගිල්ලක් තිබේද;

(ii) රජයට අයිතිව තිබූ එම ගොඩනැගිල්ලේ අයිතියෙහි වෙනසක් සිදු වී තිබේද;

(iii) එම ගොඩනැගිල්ල පෞද්ගලික පාර්ශ්වයකට බදු දී තිබේද;

(iv) එසේ නම්, එහි වාර්ෂික බදු මුදල කොපමණද;

(v) එම ගොඩනැගිල්ල සහ ඊට අයිති දේපළ පෞද්ගලික අංශයට බදු දෙන ලද දිනය කවරේද;

(vi) එම ගොඩනැගිල්ල බදු දෙන අවස්ථාව වනවිට කර්මාන්ත විෂය භාරව කටයුතු කරන ලද අමාත්‍යවරයාගේ නම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම ගොඩනැගිල්ල සහ ඊට අයිති දේපළ නැවත රජයට පවරා ගැනීම සඳහා කටයුතු නොකිරීමට හේතු කවරේද;

(ii) එම පේෂ කර්මාන්ත මධ්‍යස්ථානය මඟින් යටිනුවර ප්‍රදේශයේ විරැකියාවෙන් පෙළෙන තරුණයන් දහස් සංඛ්‍යාවකට රැකියා උත්පාදනය කළ හැකි බව පිළිගන්නේද;

(iii) එසේ නම්, එම ගොඩනැගිල්ල නැවත රජයට පවරා ගෙන යටිනුවර ප්‍රදේශයේ පේෂ කර්මාන්ත ක්ෂේත්‍රය දියුණු කිරීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2485/2021

ගරු ලලිත් එල්ලාවල මහතා,— මහජන ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජනතා විමුක්ති පෙරමුණේ හිටපු නායක රෝහණ විජේවීර මහතාව 1989.11.12 වන දින එවකට පැවති රජය විසින් අත්අඩංගුවට ගෙන ඒ බව මාධ්‍ය මඟින් ප්‍රකාශයට පත් කරන ලද බවත්;

(ii) 1989.11.13 වන දින ඔහු මිය ගොස් ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) රෝහණ විජේවීර මහතාගේ මරණය ස්වභාවික මරණයක්ද;

(ii) නොඑසේ නම්, ඝාතනයක්ද;

(iii) එම මරණය ඝාතනයක් නම්, ඒ සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ අධිකරණයක් මඟින් ලබා දෙන ලද නඩු තීන්දුවක් තිබේද;

(iv) මෙම මරණය සම්බන්ධයෙන් ජනතා විමුක්ති පෙරමුණේ සාමාජිකයකු හෝ නායකයකු හෝ විසින් නීති මඟින් කටයුතු කිරීමට පියවර ගෙන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?